# ජාතික සමාජ සංවර්ධන ආයතනය

## ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා යටතේ උපාධි පිරිනැමීමට බලය ඇති ආයතනයක්

# වාර්ෂික වාර්තාව - 2019

# පටුන


| | පිටු අංකය |
| --- | --- |
| වාර්ෂික වාර්තාව - 2019 | 01 - 59 |
| අවසන් ගිණුම - 2019 | 60 - 80 |
| විගණකාධිපති වාර්තාව | 81 - 82 |
| අවසාන ගිණුම් පිළිබඳ විගණන මතය | 83 - 88 |
| විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්ගේ නිරීක්ෂණයන් | 89 - 91 |

# ජාතික සමාජ සංවර්ධන ආයතනය

## දැක්ම

**සමාජ වැඩ අධ්‍යාපනයේ පුහුණු කටයුතුවල හා පර්යේෂණවල දේශීය හා ජාත්‍යන්තර ලෙස විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්වීම.**

## මෙහෙවර

**ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය සහ සමාජ සුභසාධනය සඳහා සියලුම මට්ටම්වලදී අවශ්‍ය සමාජ වැඩ පිළිබඳ කුසලතා පූර්ණ මිනිස් බල අවශ්‍යතා සපුරාගැනීම සමාජ වැඩ පිළිබඳ අවශ්‍ය දැනුම හා තාක්ෂණයන් යොදා ගනිමින් සමාජයට සුවිශේෂී සේවයක් සැපයීම.**

## සමාලෝචනය

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික සමාජ සංවර්ධන ආයතනය සමාජ වැඩ පිළිබඳව (Social Work) අධ්‍යාපනය ලබාදෙන ශ්‍රී ලංකාවේ ඇති එකම අධ්‍යාපන ආයතනය වේ. 1992 අංක 41 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ජාතික සමාජ සංවර්ධන ආයතනය නමින් උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ස්ථාපිත වූ මෙම ආයතනය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනතේ 25 A වගන්ති යටතේ උපාධි පිරිනැමීමට බලය ඇති ආයතනයක් ලෙස 2005 වර්ෂයේදී ප්‍රකාශයට පත් කර ඇත. සමාජ සංවර්ධනය උදෙසා සමාජ වැඩ, සමාජ සුභසාධනය, සමාජ සංවර්ධනය සහ මනෝ විද්‍යාත්මක උපදේශනය යන ක්ෂේත්‍රයන්ට අදාළ අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ වැඩසටහන් හා පාඨමාලා ගණනාවක් සතුටුදායක ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. ඉහත කාර්යයන් සාර්ථක ලෙස ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය, පුහුණු අංශය හා පර්යේෂණ අංශය ලෙස දැනට අධ්‍යයන අංශ තුනක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඊට අමතරව පාලන හා මුදල් අංශයක්ද ක්‍රියාත්මක වේ.

අධ්‍යයන අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන පශ්චාත් උපාධි, උපාධි, ඩිප්ලෝමා, සහතික පත්‍ර හා පුහුණු හා කෙටිකාලීන පාඨමාලා සියල්ලම ජාතික අවශ්‍යතාවයට ගැලපෙන පරිදි අවශ්‍යතා තක්සේරු වාර්තා අනුව සකස් කරන ලද විෂය නිර්දේශයන්ගෙන් සමන්විත වේ. මෙම විෂය නිර්දේශයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නිර්දේශයන්ට අනුව (SLQF) ඉතා උසස් මට්ටමකින් අදාල ක්ෂේත්‍රයේ වෘත්තිකයින්, අධ්‍යාපනඥයින් හා අභ්‍යන්තර අධ්‍යයන කාර්ය මණ්ඩලය එක්ව සකසා ඇත.

සමාජ සේවා විද්‍යාලය මඟින් පවත්වන වැඩසටහන් අතර වෘත්තීය සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා හා ශාස්ත්‍රවේදී සමාජ වැඩ උපාධිය හා සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ප්‍රධාන වේ. මීට අමතරව සංඥා භාෂා පර්වර්තක ඩිප්ලෝමා පාඨමාලාව මෙම වසරේදී ආරම්භ කරන ලදී.

පුහුණු අංශය මඟින් ඩිප්ලෝමා පාඨමාලා රාශියක් පවත්වාගෙන යන අතර උපදේශනය, වැඩිහිටි රැකවරණය, සමාජ රැකවරණය, ප්‍රජා පාදක විශෝධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන් මේ අතර වේ. එමෙන්ම උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ වී ඇති අතර එය උපාධි පාඨමාලාවක් දක්වා සංවර්ධනය කරමින් පවතී. මීට අමතරව සහතික පත්‍ර පාඨමාලා හා කෙටිකාලීන පුහුණු වැඩසටහන් දිවයින පුරා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි ඉල්ලීම පරිදි පවත්වනු ලබන අතර මෙමඟින් සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ නියුතු නිලධාරීන්ගේ ධාරිතාවය වර්ධනය කිරීම අරමුණ වේ. සීදූව කේන්ද්‍රස්ථානය කරගනිමින් කොළඹ, යාපනය, මන්නාරම, කිලිනොච්චිය, අම්පාර, වව්නියාව, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුරය සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කයන්හි ඉහත පාඨමාලා දැනට පවත්වාගෙන යනු ලබයි.

පර්යේෂණ හා ප්‍රකාශන අංශය විසින් ශ්‍රී ලාංකීය සමාජ ප්‍රතිපත්ති ගොඩනැංවීම උදෙසා විවිධ පර්යේෂණ දියත් කොට ඇත. එම අංශ විසින් පර්යේෂණ මුල් කරගනිමින් සකස්කොට ඇති පර්යේෂණ වාර්තා හා ග්‍රන්ථ සමාජ සංවර්ධන හා සමාජ සුභසාධන ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා බෙහෙවින්ම යොදාගත හැක. ආයතනයට අනුබද්ධිතව ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන හතරක් අනුරාධපුර තලාව, අම්පාර, හම්බන්තොට රන්න හා කිලිනොච්චි යන ප්‍රදේශයන්හි ආරම්භ කර ඇත. කොළඹට කේන්ද්‍ර වෙමින් පවතින ආයතනික වැඩසටහන් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි වෙසෙන සිංහල, දමිළ, මුස්ලිම් ප්‍රජාව වෙත රැගෙන යාම මෙම ප්‍රාදේශීය මධ්‍යස්ථාන ආරම්භ කිරීමේ අරමුණ වේ.

එමෙන්ම ආයතනයට ස්ථිර ගොඩනැගිලි සංකීර්ණයක් සීදූව ප්‍රදේශයේ ඉදිකරමින් පවතින අතර එහි පළමු අදියර හා දෙවන අදියර වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර පළමු අදියරේ වැඩ අවසන් කර ආයතනය එම ස්ථානයේ ආයතනය ස්ථානගත කර ඇති අතර දෙවන අදියරෙහි ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී. ඒ අනුව ගොඩනැගිලි සංකීර්ණය සඳහා රුපියල් බිලියන 01ක මුදලක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් වෙන්කර ඇත.

ආයතනය මඟින් ජාතික මෙන්ම ජාත්‍යන්තර ආයතන හා සංවිධාන සමඟ විවිධ වූ අධ්‍යයන වැඩසටහන් පවත්වාගෙන යන අතර බෙල්ජියම්හි ලින්ග්බර්ග් ලියුවින් විශ්වවිද්‍යාලය සමඟ අධ්‍යයන පුහුණු හා පර්යේෂණ කටයුතු ජාත්‍යන්තර මට්ටමින් ව්‍යාප්ත කිරීමේ අරමුණින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. එමඟින් ආයතනයේ අරමුණු හා කාර්යභාරය ප්‍රජාව අතරට ගෙන යාමේ අවස්ථා තවත් පුළුල් වී ඇත. වර්තමානයේ ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය උදෙසා ආයතනය මඟින් මහඟු කාර්යභාරයක් ඉටු කරමින් සිටින අතර 67 වසරක ඉතිහාසය තුල ආයතනය මඟින් සිදු කරන සත්කාරය ප්‍රශංසනීය බව ප්‍රකාශ කරමි.

**එම්. ටී. ආර්. ෂාමිණී අත්තනායක**
**අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.),**
**ජාතික සමාජ සංවර්ධන ආයතනය**

# ජාතික සමාජ සංවර්ධන ආයතනය

## වාර්ෂික වාර්තාව - 2019

### 01. හැඳින්වීම

1992 අංක 41 දරණ පාර්ලිමේන්තු පනත යටතේ ස්ථාපනය කර ඇති ජාතික සමාජ සංවර්ධන ආයතනයෙහි ආරම්භය 1952 දී ස්වෙච්ඡා සංවිධාන කිහිපයක සහභාගිත්වයෙන් පිහිටුවා ගන්නා ලද "සමාජ වැඩ පිළිබඳ ආයතනයයි". 1964 දී මෙය රජයට පවරා ගනු ලැබීමත් සමග "ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය" ලෙස නම් කෙරිණි.එයින් පසුව ඉහත පනත යටතේ ජාතික සමාජ සංවර්ධන ආයතනය බවට පත්වූ අතර 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ අංක 25A වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ උපාධි පිරිනමන ආයතනයක් බවට පත්විය.

**1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ සඳහන් කර ඇති පරිදි ආයතනයේ අරමුණු වනුයේ,**

01. වෘත්තීය සමාජ වැඩ අධ්‍යාපනය, සමාජ සුභ සාධන කළමනාකරණය හා සමාජ සංවර්ධනය පිළිබඳ උසස් පාඨමාලා පැවැත්වීම, ප්‍රවර්ධනය හා ඒවා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මට්ටමකට ගෙන යාම.

02. පුහුණු පාඨමාලා පුළුල් කිරීම, ශක්තිමත් කිරීම, සමාජ සුභ සාධනය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ වෙනත් ආයතන සමඟ සහයෝගිත්වයෙන් ඒවා පැවැත්වීම, අඩු වරප්‍රසාද ලාභීන් බල ගැන්වීම, මානව කුසලතා හා වෘත්තිය කුසලතා සංවර්ධනය තුලින් පුද්ගලයන්ට වඩා හොඳ ජීවන මට්ටමක් ලබා දීම.

03. සමාජ වැඩ අධ්‍යාපනය, පුහුණුව හා සමාජ සුභසාධනය හා සංවර්ධනයට අදාල පර්යේෂණ කටයුතු කිරීම, ප්‍රවර්ධනය හා පවත්වාගෙන යාම තුලින් සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ දියුණුව සැලසීම.

04. සමාජ සුභ සාධනය හා සමාජ සංවර්ධනය සම්බන්ධ ප්‍රතිපත්ති සැකසීමට, සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විශේෂ දායකත්වය සැපයීම.

05. ඉහත සියළුම අරමුණු සාර්ථකව ලගා කර ගැනීමට අවශ්‍ය වන මුල්‍යමය අධ්‍යයන හා අනධ්‍යයන මිනිස් බලය හා විශේෂයෙන් ජාතික සමාජ සංවර්ධන ආයතනයට ස්ථිර ස්ථානයක් ස්ථාපනය කර ගැනීම වැනි යටිතල පහසුකම් ඇතුලු අනෙකුත් සම්පත් ලබා ගැනීම.

**ඉහත කරුණු සාක්ෂාත් කරගැනිම සඳහා මෙම ආයතනය පහත සඳහන් කාර්යන්හි නිරත වේ.**

01. සමාජ වැඩ වෘත්තීයවේදි අධ්‍යාපනය.
02. සමාජ වැඩ පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර පුහුණු පාඨමාලා පැවැත්වීම.
03. සමාජ වැඩ සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂණ හා ප්‍රකාශන පළ කිරීම.
04. සමාජ සුභසාධන ක්ෂේත්‍රයේ උපදේශන සේවා පැවැත්වීම.
05. සමාජ සුභසාධන කටයුතු වල නියැලි සිටින රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල සේවකයින්ගේ කළමනාකරණ හා වෘත්තීය කුසලතා වැඩි දියුණු කිරීම.
06. සමාජ සුභසාධන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගරු ඇමතිතුමාට අවශ්‍ය සහය ලබා දීම.

**ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ක්‍රියාත්මක වැඩ සටහන් පහත සඳහන් පරිදිය.**

01. සමාජවැඩපිළිබඳ ශාස්ත්‍රපති, සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා, සමාජ වැඩ ඩිප්ලෝමා, අතුරු වෘත්තිය පාඨමාලා හා වෙනත් පුහුණු පාඨමාලා සඳහා විෂයමාලා සංවර්ධනය, සංවිධානය කිරීම, පැවැත්වීම සහ ක්ෂේත්‍ර වැඩ සම්බන්ධීකරණය

02. සමාජ සුභසාධන හා සමාජ ප්‍රතිපත්ති පිලිබඳ පර්යේෂණ දියුණු කිරීම, පැවැත්විම හා ක්‍රියාත්මක කිරීම

03. සමාජ වැඩ ප්‍රකාශන හා පත්‍රිකා එළි දැක්වීම

04. සමාජ සුභසාධන කාර්යන්හි නියැලෙන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල නිලධාරීන්ගේ වෘත්තිමය කළමනාකරණ සංවර්ධනය කිරීම සඳහා විදේශීය හා දේශීය ආයතන වල මූල්‍ය පහසුකම් ඇතිව සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම

05. ගරු ඇමතිතුමාට සමාජ සුභසාධන ප්‍රතිපත්ති සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට, සහාය විම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනිමට සහය විම සහ ඒ සඳහා ලිඛිත යෝජනා ඉදිරිපත් කිරිම

06. රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශ වල සමාජ සුභසාධන සැලසුම් ක්‍රියාත්මක කිරිමේදි සමාජ වැඩ සිසුන් එම ආයතන වලට ඔවුන්ගේ ව්‍යාපෘති මගින් අනුයුක්ත කිරීම, ඔවුන්ගේ සංවර්ධන ක්‍රියාදාමයන්ට අවශ්‍ය මාර්ගෝපදේශයන් සැපයීම, ඔවුන්ගේ සේවාවන් වඩාත් අර්ථවත් පිණිස උපදේශන සේවා රැස්විම් හා සම්මන්ත්‍රණ පැවැත්වීම.

## 02. පාලක සභාව

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 7 (1) උප වගන්තිය ප්‍රකාරව 2019 වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතන පාලක සභාවේ සංයුතිය මෙසේය.

| | | |
|---|---|---|
| 1. අශෝකා අලවත්ත මිය (සභාපති-නිල බලයෙන්) | - | ලේකම් - ප්‍රාථමික කාර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම අමාත්‍යාංශය 2018.12.21 - 2019.10.30 |
| 2. එම්.ටී.ආර්.ශාමිණි අත්තනායක මිය | - | අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) 2019.01.01 - 2019.10.30 |
| 3. මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න මහතා | - | සාමාජික 2015.03.03 - 2019.10.30 |
| 4. ඊ.කේ. ගනිහිගම මහතා | - | සාමාජික 2015.03.03 - 2019.10.30 |
| 5. විශාකා අමරසේකර මෙනෙවිය | - | සාමාජික 2019.02.08 - 2019.10.30 |
| 6. ඒ.එල්.වී.අයි. ලියනරත්න මහතා | - | සාමාජික 2019.03.28 - 2019.10.30 |
| 7. පූජ්‍ය දඹර අමිල හිමි | - | සාමාජික 2019.02.11 - 2019.10.30 |
| 8. මහාචාර්ය ඒ.පී.එන්.ඩී.එස්. අබේසුන්දර මහතා | - | සාමාජික 2019.02.11 - 2019.10.30 |
| 9. මහාචාර්ය කුසුමා එදිරිවීර කරුණාරත්න මහත්මිය | - | සාමාජික 2019.02.11 - 2019.10.30 |
| 10 ආචාර්ය අයි. දිසානායක මහතා | - | සාමාජික 2019.02.11 - 2019.10.30 |
| 11. ආචාර්ය ඩී.ටී. කිංස්ලි බර්නාඩ් මහතා | - | සාමාජික 2019.02.11 - 2019.10.30 |
| 12. ආචාර්ය එන්.ඩී. චන්දිමා විජේගුණවර්ධන මහත්මිය | - | සාමාජික 2019.02.11 - 2019.10.30 |
| 13. ආචාර්ය පී. ජේ. කුමාරසිංහ මහතා | - | සාමාජික 2019.02.11 - 2019.10.30 |
| 14. ඉංජි. බන්දුල වික්‍රමාරච්චි මහතා | - | සාමාජික 2019.02.11 - 2019.10.30 |

## 03. අධ්‍යයන කටයුතු පිළිබඳ මණ්ඩලය

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 10 (1) උප වගන්තිය ප්‍රකාරව අංක 796/11 හා 1993.12.09 දින රජයේ ගැසට් පත්‍රයේ දක්වා ඇති නියමයන්ට අනුව පත් කරන ලද අධ්‍යයන කටයුතු මණ්ඩලය මෙසේය.

| | | | |
|---|---|---|---|
| 1. | අශෝකා අලවත්ත මිය (සභාපති - නිල බලයෙන් ) | - | ලේකම්, ප්‍රාථමික කාර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය 2019.02.11 - 2019.10.30 |
| 2. | එම්.ටි.ආර්. ෂාමිණි අත්තනායක මිය | - | අධ්‍යක්ෂ ජනරාල් (රා.ආ.) 2018.07.09 – 2019.01.01 දක්වා - 2019.01.01 සිට අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) |
| 3. | මහාචාර්ය ඩබ්.එම්. ධනපාල මහතා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,සමාජ විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 4. | මහාචාර්ය දයා එදිරිසිංහ මහතා | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය |
| 5. | ආචාර්ය උපාලි පන්නිලගේ මහතා | - | පීඨාධිපති - මානව ශාස්ත්‍ර පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය |
| 6. | මහාචාර්ය ප්‍රේමකුමාරද සිල්වා මහතා | - | පීඨාධිපති සමාජ විද්‍යා පීඨය කොළඹ විශ්වවිද්‍යාලය |
| 7. | ආචාර්ය ඒ.ඩබ්.කේ.ඩබ්. සුහසිංහ මිය | - | මහාචාර්ය කැළණිය විශ්වවිද්‍යාලය |
| 8. | ආචාර්ය එස්.එම්.ඒ.කේ. සමරකෝන් මහතා | - | අංශාධිපති, වාණිජ හා කළමනාකරණ පීඨය කොළඹ විශ්වවිද්‍යාලය |
| 9. | කේ.එම්.වයි.කරුණාරත්න මහතා | - | අධ්‍යක්ෂ (සමාජ සේවා විද්‍යාලය) |
| 10. | ගෞරි වාසුදේවන් මිය | - | අධ්‍යක්ෂ (පුහුණු අංශය) ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 11. | එම්.එස්.එම්. අස්මියාස් මහතා | - | අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන ප්‍රතිපත්ති පර්යේෂණ හාප්‍රකාශන අංශය) ජාතික සමාජ සංවර්ධන ආයතනය |
| 12. | සී.එච්.ඩී. හෙට්ටිආරච්චි මහත්මිය | - | ලේඛකාධිකාරි |

## 04. කාර්ය මණ්ඩලය

### (අ) පරිපාලන කාර්ය මණ්ඩලය

2019 වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පරිපාලන අංශයේ සංයුතිය පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| 01. | එම්.ටී.ආර්. ෂාමිණි අත්තනායක මිය | - | අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) 2019.01.01 සිට මේ දක්වා |
| 02. | එල්.කේ. පුෂ්පකාන්ති මිය | - | අධ්‍යක්ෂ (පාලන හා මුදල්) 2017.03.01 සිට මේ දක්වා |
| 03. | කේ.එස්.ඩබ්. වික්‍රමසිංහ මහතා | - | ගණකාධිකාරී 2015.12.03 සිට 2019.07.03 දක්වා |
| 04. | එම්.කේ. පලිහක්කාර මිය | - | පරිපාලන නිලධාරි 2005.07.01 සිට 2019.11.16 දක්වා |
| 05. | සී.එච්.ඩී. හෙට්ටිආරච්චි මිය | - | ලේඛකාධිකාරී 2013.09.16 සිට මේ දක්වා |
| 06. | යූ.ඩී.ඩී. ධනුෂ්කා උස්හෙට්ටි මිය | - | අභ්‍යන්තර විගණක 2011.10.17 සිට මේ දක්වා |

පරිපාලන අංශයේ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

| තනතුර | අනුමත සේවක සංඛ්‍යා | ස්ථිර | ද්විතියන පදනම | අනියම් |
|---|---|---|---|---|
| 01.ගිණුම් නිලධාරී | 01 | 01 | - | - |
| 02.සහකාර ලේඛකාධිකාරී | 01 | 01 | - | - |
| 03.පරිගණක වැඩසටහන් සම්පාදක | 01 | 01 | - | - |
| 04.ව්‍යාපෘති වැඩසටහන් සම්පාදක | 01 | 01 | - | - |
| 05.කළමනාකරණ සහකාර | 34 | 34 | - | - |
| 06.නේවාසිකාගාර පාලිකා | 01 | 01 | - | - |
| 07.ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික | 01 | - | - | - |
| 08.ශ්‍රව්‍ය දෘශ්‍ය සහායක | 01 | 01 | - | - |
| 09.භාෂා පරිවර්තක | 02 | 01 | - | - |
| 10.පිළිගැනීමේ නිලධාරිනි/දුරකථන ක්‍රියාකරු | 01 | 01 | - | - |
| 11.රියදුරු | 09 | 09 | - | - |
| 12.කාර්යාල කාර්ය සහායක | 15 | 13 | - | - |
| 13.වැඩසටහන් සහකාර (ස්ථානභාර) | 04 | 03 | - | - |
| 14.මුරකරු | 01 | 01 | - | - |

**(ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලය**

2019 වර්ෂය තුල ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංයුතිය මෙසේය.

01. එම්.ටී.ආර්. ෂාමිණී අත්තනායක මිය - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන) 2017.01.16 සිට

## 1. සමාජ සේවා විද්‍යාලය

01. කේ.එම්.වයි. කරුණාරත්න මහතා - අධ්‍යක්ෂ (සමාජ සේවා විද්‍යාලය) 2017.01.24 සිට මේ දක්වා

02. වර්ධරාජා ජයරුබන් මහතා - කථිකාචාර්ය II 2006.07.03 සිට 2012.07.02 දක්වා
කථිකාචාර්ය I 2012.07.03 සිට 2017.07.31 දක්වා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 2017.08.01 සිට මේ දක්වා

03. ඊ.ඒ.එම්.එස්.ජී. විජේසේකර මිය - කථිකාචාර්ය II 2006.07.03 සිට 2012.07.06 දක්වා
කථිකාචාර්ය I 2012.07.07 සිට 2017.07.31 දක්වා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 2017.08.01 සිට මේ දක්වා

04. යු.එල්.එම්. අශ්කර් මහතා - කථිකාචාර්ය II 2009.03.02 සිට 2015.03.01 දක්වා
කථිකාචාර්ය I 2015.03.02 සිට මේ දක්වා

05. එස්. සිවකුමාරන් මිය - කථිකාචාර්ය II 2013.09.16 සිට 2019.03.15 දක්වා

06. එම්.කේ.පී.අයි.යු. ගුණරත්න මිය - කථිකාචාර්ය II 2013.09.16 සිට මේ දක්වා

07. සී.එම්. මුණසිංහආරච්චි මිය - කථිකාචාර්ය II 2013.09.16 සිට මේ දක්වා

08. වී. බාලමති මිය - කථිකාචාර්ය II 2013.09.16 සිට මේ දක්වා

09. එච්.එම්.ඩී.එස්. හේරත් මිය - කථිකාචාර්ය II 2014.05.02 සිට මේ දක්වා
10. එල්.ආර්. අබේවික්‍රම මෙනවිය - කථිකාචාර්ය II 2014.05.02 සිට 2019.03.23 දක්වා
11. එච්.එම්.එස්. නිරෝෂණී මිය - කථිකාචාර්ය II 2014.05.02 සිට මේ දක්වා
12. එල්.සී. ඉනෝකා ජයසේන මිය - කථිකාචාර්ය II 2015.12.01 සිට මේ දක්වා
13. වයි.එච්. සමුද්‍රිකා සිල්වා මෙනවිය - කථිකාචාර්ය II 2015.12.01 සිට මේ දක්වා
14. ඒ.එම්. මානාමුදලි මෙය - කථිකාචාර්ය II 2018.08.01 සිට මේ දක්වා
15. ඒ.පී.එල්. බුද්ධි නිරුක්ෂි මිය - කථිකාචාර්ය II 2018.08.01 සිට මේ දක්වා
16. ඩී.එම්.ඩබ්.කේ. චන්ද්‍රසිරි මහතා - පුස්තකාලයාධිපති 2015.06.01 සිට මේ දක්වා

## 2. පුහුණු අංශය

01. වරදගෞරි වාසුදේවන් මිය - අධ්‍යක්ෂ (පුහුණු) 2015.05.05 සිට මේ දක්වා
02. දිප්ති නිරෝෂිකා මිය - පුහුණු නිලධාරි II 2007.03.01සිට 2013.02.28 දක්වා
පුහුණු නිලධාරි I 2013.03.01 සිට 2018.07.31 දක්වා
ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරි 2018.08.01 සිට මේ දක්වා
03. කුමුදිනි වැදිසිංහ මිය - පුහුණු නිලධාරි II 2012.05.01 සිට 2019.09.30 දක්වා
ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරි 2019.10.01 සිට මේ දක්වා
04. බී.කේ.එස්. කරුණාරත්න මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
05. පී.සී. හෙට්ටිආරච්චි මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
06. ඒ.එම්.කේ.එල්. අධිකාරි මිය - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
07. ඒ.එච්. උබයදුල්ලා මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
08. ජේ.එච්.අයි. ප්‍රසාද් මහතා - පුහුණු නිලධාරි II 2013.08.01 සිට මේ දක්වා
09. ටී. තර්ෂන් මහතා - පුහුණු නිලධාරි II 2013.09.02 සිට මේ දක්වා
10. වයි.එම්. නිම්සාත් මහතා - පුහුණු නිලධාරි II 2017.07.03 සිට මේ දක්වා
11. බී.ජී.අයි. මදුෂානී සමරසිංහ මිය - පුහුණු නිලධාරි II 2017.07.03 සිට මේ දක්වා

## 3. සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය

01. එම්.එස්.එම්. අස්මියාස් මහතා - අධ්‍යක්ෂ (පර්යේෂණ) 2017.05.01 සිට මේ දක්වා
02. ජේ.කේ.පී.යූ. කීර්ති මහතා - පර්යේෂණ නිලධාරි 2013.08.01 සිට 2018.07.31දක්වා
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි 2018.08.01 සිට මේ දක්වා
03. එස්. හරිහරතාමෝදරන් මයා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි 2018.08.01 සිට මේ දක්වා
04. එච්.කේ.එස්.කේ. සිරිකුමාර මිය - පර්යේෂණ නිලධාරි 2014.05.02 සිට මේ දක්වා
05. බී.ඒ. නිලූකා විජේබණ්ඩාර මිය - පර්යේෂණ නිලධාරි 2017.01.16 සිට මේ දක්වා
06. කේ.ඩබ්.ටී.කේ. කරඳවල මිය - පර්යේෂණ නිලධාරි 2017.07.03 සිට 2019.04.23 දක්වා
07. ඒ.එච්.ඉන්දික සංජීව මහතා - පර්යේෂණ සහකාර 2014.05.02 සිට මේ දක්වා
08. කේ.සී.කේ.ද තාබ්‍රෙව් මෙය - පර්යේෂණ සහකාර 2014.05.02 සිට මේ දක්වා
09. ඒ.එරන්ති ජයවර්ණ මෙය - පර්යේෂණ සහකාර 2014.05.02 සිට මේ දක්වා
10. එස්.එච්.එන්. මධුෂානි සිල්වා මෙය - පර්යේෂණ සහකාර 2014.05.02 සිට මේ දක්වා
11. එන්.ඩබ්.ටී. චින්තක මහතා - පර්යේෂණ සහකාර 2017.07.10 සිට 2019.06.30 දක්වා

**විදේශ ශිෂ්‍යත්ව හා පුහුණු වීම් සඳහා සහභාගි වූ නිලධාරීන්**

01. එම්.මුණසිංආරච්චි මිය - 25th Asia pacific joint regional Social work Conference 2019.09.17-20 ඉන්දියාව
02. එම්.කේ.ජී.අයි.යූ. ගුණරත්න මිය - එම -
03. එච්.එම්.ඩී.එස්. හේරත් මෙනවිය - එම -
04. එච්.එම්.එස්. නිරෝෂණී මිය - එම -
05. කේ.එස්. වැදිසිංහ මිය - එම -
06. එම්.ටී.ආර්.එස්. අත්තනායක මිය - 4th Edition of the social work International conference 2019.11.07-08 රුමේනියාව

**දේශීය පුහුණුවීම් සඳහා සහභාගී වූ නිලධාරීන්**

1. මාර්ග නීති වලට අනුකූලව හා ආරක්ෂිතව රිය පැදවීම සහ මහජන සම්බන්ධතාවය වැඩිදියුණු කර යහපත් ආකල්ප වර්ධනය කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ එක් දින වැඩසටහන - 2019.02.08 - නිලධාරීන් 04
2. ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනට සමගාමීව අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතන වල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන 2019.02.26 - නිලධාරීන් 06
3. අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතන වල නිලධාරීන් හට යහපත් සෞඛ්‍ය පුරුදු පවත්වාගෙන යාම සහ විවිධ බෝ නොවන රෝගවලින් මිදීම සඳහා හේතුවන ආහාර පාලනය කරන අයුරු හා සීනි භාවිතය සම්බන්ධ දැනුවත් කිරීමේ වෛද්‍ය සායනය - 2019.03.05 - නිලධාරීන් 31
4. 2018 අංක 19 දරණ විගණන පනත පිළිබඳව අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතන වල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන - 2019.04.01 දින - නිලධාරීන් 30
5. ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ දෙදින වැඩමුළුව - 2019.05.02 හා 03 - සීමාසහිත නිපුනතා සංවර්ධන අරමුදල පරිශ්‍රයේ පිහිටි ශ්‍රවනාගාරය - නිලධාරීන් 10
6. කාර්යාල කාර්ය සහායකයින්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ දැමීම පිළිබඳ දෙදින වැඩමුළුව - සීමාසහිත නිපුනතා සංවර්ධන අරමුදල පරිශ්‍රයේ පිහිටි ශ්‍රවනාගාරය - නිලධාරීන් 07
7. නිල බැංකු ගිණුම් නඩත්තුව පිළිබඳ එක්දින වැඩමුළුව - 2019.05.30 - සීමාසහිත නිපුනතා සංවර්ධන අරමුදල පරිශ්‍රයේ පිහිටි ශ්‍රවනාගාරය - නිලධාරීන් 02
8. වර්තමාන කාර්යාල ක්‍රම හා කාර්යාල කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - 2019.05.15 නිලධාරීන් - සෙත්සිරිපාය II අදියර I මහල පිහිටි ශ්‍රවනාගාරය - නිලධාරීන් 06
9. අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතන වල නිලධාරීන් හට බෝනොවන රෝගවලින් වැළකීම සඳහා පවත්වනු ලබන වෛද්‍ය සායනය - සෙත්සිරිපාය II අදියර I මහල පිහිටි ශ්‍රවනාගාරය - නිලධාරීන් 10
10. බඳවාගැනීම් පරිපාටිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන රු.14,000/= - ඩී.එම්.පී.දි සානායක මිය හා එන්.එච්. හේවාපතිරණ මෙය - PRAG ආයතනය - 2019.06.13
11. වඩාත් සංවේදී රාජ්‍ය සේවයක් උදෙසා අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතන වල නිලධාරන් සඳහා පවත්වනු ලබන ගීතාලංකාර විචාරාත්මක සංගීතමය රසවින්දන වැඩසටහන - සෙත්සිරිපාය II අදියර I

මහල පිහිටි ශ්‍රවනාගාරය - නිලධාරීන් 13 සීමාසහිත නිපුනතා සංවර්ධන අරමුදල පරිශ්‍රයේ පිහිටි ශ්‍රවනාගාරය - 2019.06.17 - නිලධාරීන් 07

12. පරිපාලන නිලධාරීන් සතු වගකීම හා කාර්යභාරය පිළිබඳ තුන්දින පුහුණු වැඩසටහන - සීමාසහිත නිපුනතා සංවර්ධන අරමුදල පරිශ්‍රයේ පිහිටි ශ්‍රවනාගාරය 2019 ජූනි මස 17, 18, 19 - නිලධාරීන් 02
13. ප්‍රසම්පාදන කොමිෂන් සභාව සහ යෝජිත නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශසංග්‍රහය පිළිබඳ දෙදින වැඩමුළුව 2019.06.27, 28 දිනයන්හි සීමාසහිත නිපුනතා සංවර්ධන අරමුදල පරිශ්‍රය - නිලධාරීන් 04
14. 2018 අංක 19 දරණ විගණන පනත පිළිබඳව අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතන වල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන - සෙත්සිරිපාය II අදියර II වන මහලේ නාගරික සංවර්ධන අධිකාරියට අයත් ශ්‍රවනාගාරය - 2019.07.05 දින - නිලධාරීන් 07
15. නව ව්‍යාපෘති යෝජනා ආකෘති පත්‍රය හඳුන්වාදීම පිළිබඳ පුහුණු වැඩමුළුව - අමාත්‍යාංශ ශ්‍රවනාගාරය - 2019.08.05 - නිලධාරීන් 05
16. අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන - 2019 අගෝස්තු 22 - සීමාසහිත නිපුනතා සංවර්ධන අරමුදල පරිශ්‍රයේ පිහිටි ශ්‍රවනාගාරය - නිලධාරීන් 03
17. AAT ආයතනයේ වාර්ෂික රැස්වීම - යූ.ඩී.ඩී.ඩී උස්හෙට්ටි මහත්මිය (අභ්‍යන්තර විගණක) - රු.12,600/=
18. 2016 අංක 12 දරණ තොරතුරු දැනගනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත සම්බන්ධව අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන වල මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන - අමාත්‍යාංශ ශ්‍රවනාගාරය - 2019.09.17 - නිලධාරීන් 12
19. නවීන චින්තනය හා ආකල්ප ගොඩනැගීම පිළිබඳ එක්දින සම්මන්ත්‍රණය 2019.10.08 - සෙත්සිරිපාය II අදියර II වන මහලේ නාගරික සංවර්ධන අධිකාරියට අයත් ශ්‍රවනාගාරය - නිලධාරීන් 10
20. රියදුරු මහතුන්ගේ ආකල්ප හා දැනුම ඉහළ නැංවීම පිළිබඳ දෙදින වැඩමුළුව - 2019.10.24, 24 - සීමාසහිත නිපුනතා සංවර්ධන අරමුදල පරිශ්‍රයේ පිහිටි ශ්‍රවනාගාරය - නිලධාරීන් 01

## 1. වැඩසටහන් පිළිබඳ සාරාංශය (2019.12.31 දිනට)

### සමාජ සේවා විද්‍යාලය

**වගු අංක 01**
**සමාජ සේවා විද්‍යාලයේ පාඨමාලාභි ප්‍රගතිය**

| ක්‍රියාකාරකම | වෙන්කරන ලද ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි.) | භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | ව්‍යාපෘති සංඛ්‍යාව |
| | | | ස්ත්‍රී | පුරුෂ | |
| සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව 2018/2019 (ඉංග්‍රීසි) | 4,086,000.00 | 1,808,994.94 | 7 | 9 | 01 |
| සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව 2018/2019 (සිංහල) | 5,008,000.00 | 1,540,821.51 | 9 | 15 | 01 |
| සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව 2018/2019 (දෙමළ) | 3,304,000.00 | 600,000.00 | 2 | 14 | 01 |
| සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව 2019/2020 (ඉංග්‍රීසි) | 4,994,000.00 | 513,241.00 | 9 | 12 | 01 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී පාඨමාලාව 2015/2019 | 521,700.00 | 8,633,700.56 | 54 | 31 | 01 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී පාඨමාලාව 2016/2020 | 482,880.00 | | 40 | 15 | 01 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී පාඨමාලාව 2017/2018 | 662,750.00 | | 47 | 09 | 01 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී පාඨමාලාව 2018/2019 | 480,400.00 | | 38 | 17 | 01 |
| සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී පාඨමාලාව 2019/2020 | 1,933,500.00 | | 29(S)<br>26 (T)<br>17(E) | 25(S)<br>26 (T)<br>14 (E) | 03 |
| සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2018/19 (සිංහල හා දෙමළ) | 342,500.00 | | 24 | 11 | 01 |
| සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2019/20 (සිංහල හා දෙමළ මාධ්‍යය) | 569,500 | | 16(S)<br>12 (T) | 08 (S)<br>04 (T) | 02 |

සමාජ වැඩ අධ්‍යාපන කටයුතු කරගෙන යනු ලබන සමාජ සේවා විද්‍යාලයේ පවත්වනු ලබන පාඨමාලා සඳහා වියදම් වූ මුදල වගු අංක 01 මගින් විස්තර කර ඇත.

**පුහුණු අංශය**

**වගු අංක 02**

**2019.01.01 සිට 2019.12.31 දක්වා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය**

| | ක්‍රියාකාරකම | වෙන්කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.) | භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | ව්‍යාපෘති සංඛ්‍යාව |
| | | | | ස්ත්‍රී | පුරුෂ | |
| 01. | වෘත්තීය මාර්ගෝපදේශන දිනය නිමිති කරගෙන ගාල්ල සවුත්ලන්ඩ් විදුහලේ පවත්වන ලද වැඩසටහන (රන්න මධ්‍යස්ථානය) | 0.45 | | 400 | | 01 |
| | ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - ප්‍රජා මූලික සංවිධාන නායකයින් (රන්න මධ්‍යස්ථානය) | | 32,636.00 | 42 | | 01 |
| | ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - ප්‍රජා මූලික සංවිධාන නායකයින් (තලාව මධ්‍යස්ථානය) | | 26,940.00 | 25 | | 01 |
| | ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - ප්‍රජා මූලික සංවිධාන නායකයින් (අම්පාර මධ්‍යස්ථානය) | | 30,305.00 | 37 | | 01 |
| | ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - ප්‍රජා මූලික සංවිධාන නායකයින් (කිලිනොච්චිය මධ්‍යස්ථානය) | | 31,565.00 | 41 | | 01 |
| 02 | පුහුණු නාමාවලියක් සකස් කිරීම | 983,632.00 | 17,825.00 | 12 | | 01 |
| | පුහුණු නාමාවලිය | | 491,815.60 | | | 01 |
| 03 | පාඨමාලාවන් අවසන් කරන ලද සිසුන් සම්බන්ධව සිදුකරනු ලබන ප්‍රගතිය පිළිබඳ වැඩසටහන | 1,000,000.00 | | | | 01 |
| 04 | ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (කොළඹ) | 0.25 | 46,865.00 | 27 | | 01 |
| | ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (කිලිනොච්චිය) - දෙමළ මාධ්‍යය | | 44,172.00 | 19 | | 01 |
| | ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (අම්පාර) - දෙමළ මාධ්‍යය | | 68,345.00 | 35 | | 01 |
| | ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (තලාව) | | 20,820.00 | 10 | | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (අම්පාර) - සිංහල මාධ්‍යය | | 17,415.00 | 11 | 01 |
| | ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (රන්න) - සිංහල මාධ්‍යය | | 29,039.00 | 14 | 01 |
| 05 | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන - මානසික සෞඛ්‍ය දින වැඩසටහන (කිලිනොච්චිය) | 0.1 | 22,760.00 | 50 | 01 |
| | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන - මානසික සෞඛ්‍ය දින වැඩසටහන (තලාව) | | 21,903.00 | 55 | 01 |
| | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන - මානසික සෞඛ්‍ය දින වැඩසටහන (අම්පාර) | | 21,050.00 | 76 | 01 |
| | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන - මානසික සෞඛ්‍ය දින වැඩසටහන (රන්න) | | 22,081.00 | 100 | 01 |

**වගු අංක 03**

**උපදේශන පාඨමාලා පිළිබඳ ප්‍රගතිය**

| | පාඨමාලාව හා ආරම්භක දිනය | පාඨමාලා කාලය | ඇතුළත් වූ සිසුන් ගණන | පාඨමාලා ගාස්තු(රු.) |
|---|---|---|---|---|
| 01 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (අම්පාර) 2017/2019 - සිංහල මාධ්‍යය 2017.10.14 | මාස 21 | 34 | 1,734,000.00 |
| 02 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (අම්පාර - ඒ) 2017/2019 - දෙමළ මාධ්‍යය 2017.01.06 | මාස 21 | 45 | 2,295,000.00 |
| 03 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝ මාපාඨමාලාව (අම්පාර - බී) 2017/2019 - දෙමළ මාධ්‍යය 2017.03.19 | මාස 21 | 50 | 2,295,000.00 |
| 04 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (කොළඹ) 2018/2019 - සිංහල මාධ්‍යය | සමෘද්ධි දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පවත්වන ලද වසර 01 ක පාඨමාලාවකි. ආරම්භක දිනය 2018.07.06 | 38 | 6,456,000.00 |
| 05 | උපදේශනය පිළිබඳඩිප්ලෝමා පාඨමාලාව (තලාව) 2018/2019 - සිංහල මාධ්‍යය | | 42 | |
| 06 | උපදේශනය පිළිබඳඩිප්ලෝමා පාඨමාලාව (රන්න) 2018/2019 - සිංහල මාධ්‍යය | | 40 | |
| 07 | උපදේශනය පිළිබඳඩිප්ලෝමා පාඨමාලාව (කිලිනොච්චිය) 2018/2019 - දමිළ මාධ්‍යය | | 31 | |

| | | | | |
|---|---|---|---|---|
| 08 | වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2018 - සිංහල මාධ්‍යය 2018.08.03 | මාස 18 | 22 | 1,122,000.00 |
| 09 | උපදේශනය පිළිබඳඩිප්ලෝමා පාඨමාලාව (ත්‍රිකුණාමලය) 2018/2020 - දමිළ මාධ්‍යය 2018.04.07 | මාස 21 | 44 | 2,244,000.00 |
| 10 | උපදේශනය පිළිබඳඩිප්ලෝමා පාඨමාලාව (කොළඹ) 2018/2020 - සිංහල මාධ්‍යය 2018.04.07 | මාස 21 | 40 | 2,040,000.00 |
| 11 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (කොළඹ) 2018/2020 - ඉංග්‍රීසි මාධ්‍යය 2018.04.07 | මාස 21 | 27 | 1,377,000.00 |
| 12 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (කොළඹ) 2018/2020 - දෙමළ මාධ්‍යය 2018.04.07 | මාස 21 | 46 | 2,040,000.00 |
| 13 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (කොළඹ) 2019/2021 - සිංහල මාධ්‍යය 2019.02.17 | මාස 21 | 40 | 2,040,000.00 |
| 14 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (කොළඹ) 2019/2021 – දෙමළ මාධ්‍යය 2019.02.17 | මාස 21 | 43 | 2,040,000.00 |
| 15 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (කුරුණෑගල) 2019/2021 - සිංහල මාධ්‍යය 2019.06.20 | මාස 21 | 106 | 7,420,000.00 |
| 16 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (රත්නපුරය) 2019/2021 - සිංහල මාධ්‍යය 2019.06.17 | | | |
| 17 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (මාතර) 2019/2021 - සිංහල මාධ්‍යය 2019.06.10 | | | |
| 18 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (කිලිනොච්චිය) 2019/2021 - දෙමළ මාධ්‍යය 2019.07.15 | මාස 21 | 32 | 1,632,000.00 |
| 19 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (යාපනය) 2019/2021 - දෙමළ මාධ්‍යය - 2019.06.09 | මාස 21 | 51 | 2,601,000.00 |
| 20 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (කොළඹ) 2019/2021 - ඉංග්‍රීසි මාධ්‍යය 2019.02.17 | මාස 21 | 37 | 1,836,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 21 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (මඩකලපුව) 2019/2021 - දෙමළ මාධ්‍යය | මාස 21 | 44 | 2,244,000.00 |
| 22 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (මඩකලපුව) 2019/2021 - දෙමළ මාධ්‍යය | මාස 21 | 44 | 2,244,000.00 |
| 23 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (අම්පාර) 2019/2021 - සිංහල මාධ්‍යය<br>2019.11.30 | මාස 21 | 21 | 866,000.00 |
| 24 | උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව<br>2019.01.27 | මාස 21 | 28 | 2,128,000.00 |
| 25 | උපදේශන පිළිබඳ ඩිප්ලෝම පාඨමාලාව (තලාව ) 2018/2020<br>2018.05.05 | මාස 21 | 35 | 1,785,000.00 |
| 26 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (කිලිනොච්චිය) 2018/2020 | මාස 21 | 40 | 1,984,000.00 |
| 27 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (නුවර) 2019/2020 | මාස 21 | 48 | 2,448,000.00 |
| 28 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (නුවර) 2018/2020 | මාස 21 | 55 | 2,805,000.00 |

පුහුණු අංශය මගින් කරගෙන යනු ලබන පාඨමාලා වගු අංක 02 හා 03 මගින් දක්වා ඇත. ඒ අනුව උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන්හි ප්‍රගතිය සහභාගී වූ සිසුන් සංඛ්‍යාවන්, මූල්‍ය ප්‍රගතිය ද මෙමගින් දක්වා ඇත.

## සමාජ සංවර්ධන ප්‍රතිපත්ති හා ප්‍රකාශන අංශය

### වගු අංක 04
### පර්යේෂණ අංශයේ වැඩසටහන් වල ප්‍රගතිය

| ක්‍රියාකාරකම | වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | ව්‍යාපෘති සංඛ්‍යාව |
| | | | ස්ත්‍රී | පුරුෂ | |
| 01. සමාජ වැඩ සගරාව | 250,000.00 | 281,000.00 | - | - | 01 |
| 02. ශ්‍රී ලංකා සමාජ සංවර්ධන සඟරාව | 269,000.00 | 264,500.00 | | | 01 |
| 03. E-Journal සමාජවැඩසගරාව | 300,000.00 | 296,000.00 | | | 01 |
| 04. පුවත්හසුන | 320,000.00 | 302,500.00 | | | 01 |
| 05. ශිෂ්‍ය සමාජ සංවර්ධන සඟරාව | 220,000.00 | 213,000.00 | | | 01 |
| 06. මැයි මස 12 හා 13 දිනයන්හි සිදුවූ ප්‍රහාරවලින් විපතට පත් පවුල් පිළිබඳ සමීක්ෂණය | ජාතික ප්‍රතිපත්තිආර්ථික කටයුතුනැවත පදිංචි කිරීම පුනරුත්ථාපන උතුරු පළාත් සංවර්ධන හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ හානිපූර්ණය සඳහා වන කාර්යාලය 951,500.00 | 855,324.00 | 1186 | 1380 | 01 |
| 07. වැඩිහිටි රැකවරණය හා රැකබලාගනු ලබන්නන්ගේ පුහුණු අවශ්‍යතා පිළිබඳ ප්‍රාරම්භක අධ්‍යයනය - 2019 | 320,000.00 | 320,514.53 | | | 01 |
| 08. රන්න ඉගෙනුම් පුහුණු හා පර්යේෂණ ප්‍රාදේශීය මධ්‍යස්ථානය ඇසුරින් සිදුකරන ලද ශක්‍යතා අධ්‍යනය | 36,000.00 | 7,200.00 | | | 01 |
| 09. ශාස්ත්‍රීය ප්‍රකාශන එළිදැක්වීමේ උළෙල | 125,000.00 | 97,507.00 | | | 01 |
| 10. ශ්‍රී ලංකාවේ දිළිඳුකම පැවතීමට හේතු සාධක පිළිබඳ සොයා බැලීමේ පර්යේෂණය (සමෘද්ධි සංවර්ධන වැඩසටහන ඇසුරින්) | 400,000.00 | 338,260.00 | 236 | 264 | 01 |
| 11. කොට්ටාව නගරයෙන් ක්‍රියාත්මක කර වන සාමාන්‍ය බස් රථ කිහිපයක් මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයට ගෙනයාම හේතුවෙන් කොට්ටාව මගී හා වෙළඳ ප්‍රජාවන්ට සිදුවිය හැකි සමාජ ආර්ථික බලපෑම පිළිබඳ සමීක්ෂණය | මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය 267,850.00 | 282,150.00 | 47 | 33 | 01 |
| 12. 2019 අපේ 21 වන දින පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් විපතටපත් පවුල් පිළිබඳ සමීක්ෂණය | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීමපුනරුත්ථාපනඋතුරු පළාත් සංවර්ධන හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ හානිපූර්ණය සඳහා වන කාර්යාලය 581,000.00 | 551,370.00 | | | 01 |
| 13.කාර්යමණ්ඩල පුහුණු වැඩමුලුව | 180,000.00 | 150,841.11 | | | 01 |

ඉහත වගු අංක 04 යටතේ සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, ප්‍රකාශන අංශය මගින් සිදු කරනු ලබන පර්යේෂණ හා ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන පිළිබඳව ද ඒ සඳහා වැය වූ මූල්‍ය ප්‍රගතියත් දක්වා ඇත.

**පුස්තකාලය**

1. පුස්තකාලය සඳහා 2019 වර්ෂයේ රු.50,000.00 ක සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍ය තුනෙන් පොත් මිල දී ගන්නා ලදී. එම පොත් ශිෂ්‍ය පරිහරණය සඳහා යොදා ඇත.
2. පුස්තකාල භාවිතය පිළිබඳ නවක පාඨකයින් දැනුවත් කිරීමේ වැඩසටහන සිදුකරන ලදි.

## සමාජ සේවා විද්‍යාලය

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පැරණිතම හා සුවිශාලම අංශය වන්නේ ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය වේ. මෙම අංශය මඟින් වෘත්තිය සමාජ වැඩ උපාධි පාඨමාලාව පවත්වාගෙන යනු ලබයි. මෙම අංශය ඉතා ඉහළ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කරන ලද, පශ්චාත් උපාධි අධ්‍යාපන සුදුසුකම් සපුරන ලද අධ්‍යයන කාර්යමණ්ඩලයකින් සමන්විත වේ. වර්තමානයේ මෙම අංශය මඟින් ප්‍රධාන අධ්‍යයන පාඨමාලාවන් තුනක් පවත්වා ගෙන යනු ලබයි.

**අරමුණ**

ශ්‍රී ලංකාවේ සමාජ වැඩ අධ්‍යාපනය විශිෂ්ඨතම මධ්‍යස්ථානය බවට පත්වීම.

**පරමාර්ථ**

1. සමාජ වැඩ අධ්‍යාපනය සඳහා වැඩසටහන් හඳුන්වා දීම
2. දැනට පවතින වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම
3. සමාජ වැඩ අධ්‍යපනය තුළ ඉංග්‍රිසි භාෂාව සහ තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම
4. සමාජ වැඩ අධ්‍යපානය සඳහා තත්ත්ව සහතිකයන් ලබා ගැනීම සඳහා කටයුතු සංවිධානය කිරීම
5. වෘත්තීමය පිළිගැනීමක් අත්පත් කර ගැනීම
6. වෘත්තීය සමාජ වැඩකරුවන් බිහි කිරීම

සමා සේවා විද්‍යාලය මඟින් පවත්වාගෙන යනු ලබන වෘත්තීය සමාජ වැඩ පාඨමාලාවන්

1. සමාජ වැඩ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (වසර දෙකයි. සිංහල, ඉංග්‍රිසි හා දෙමළ මාධ්‍යය)
2. සමාජ වැඩ ශාස්තවේදි උපාධි පාඨමාලාව (වසර හතරයි. සිංහල, ඉංග්‍රිසි හා දෙමළ මාධ්‍යය)
3. සමාජ වැඩ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (වසර දෙකයි. සිංහල, ඉංග්‍රිසි හා දෙමළ මාධ්‍යය)
4. සමාජ වැඩ සහතික පත්‍ර පාඨමාලාව (මාස හයයි. දෙමළ මාධ්‍යය)

## සමාජ වැඩ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ සුබසාධන ක්ෂේත්‍රයේ කළමනාකාරිත්ව නිපුණතාවයකින් යුතු සහ වෘත්තීමය වශයෙන් සුදුසුකම්ලත් ශ්‍රමබකාය සඳහා සමාජ වැඩ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව තුළින් විද්‍යාර්තයන් බිහි කිරීමත්, ඒ තුළින් සමාජ සංවර්ධනය සඳහා දායකවීමත් මෙහි අභිප්‍රාය වේ. මෙම අධ්‍යයන වැඩසටහන මූලික වශයෙන්ම උසස් ශාස්ත්‍රීය දැනුම ශිෂ්‍යයන්හට ලබා දීම තුළින්, දැනුමෙහි ගුණාත්මකව සිදුවන වෙනස්වීම් තුළ විශේෂ කුසලතාවයන්, තර්කානුකූල විමර්ශනයන් හා තීක්ෂණ ඇගයීමකින් සමන්විත ශ්‍රමබලකායක් බිහි කිරීමට දායක වේ. මේ තුළින් ඉතා පැහැදිලි නායකත්වයන් බිහිවීමක් සිදු වන අතර සමාජ වැඩ වෘත්තියෙහි යෙදෙන්නන් සහ සමාජ සුබසාධන ක්ෂේත්‍රයෙහි කළමනාකාරි තනතුරුවල යෙදෙන්නන් සඳහා නිපුණතාවයන් බිහි කරනු ලැබේ.

**ඇතුල්වීමේ සුදුසුකම්**

1. පළමු හෝ දෙවන පන්ති සාමාර්ථයක් සහිතව විශ්වවිද්‍යාලයකින් ප්‍රදානය කරන ලද හෝ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් පිරිනමන ලද උපාධිය හෝ
2. සාමාන්‍ය පන්ති සාමාර්ථයක් සහිතව සහ අවම වශයෙන් වසරක පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ
3. සමාජ සුබසාධන සංවිධානයක/ සංවිධානයන්හි වසර තුනක සේවා අත්දැකීම් සහ පළපුරුද්ද හෝ
4. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ උපාධි පාඨමාලාවක් හා සමාගාමී ශ්‍රී ලංකා වෘත්තීය සුදුසුකමක් හා අවම වශයෙන් වසර පහක සමාජ සුබසාධන ආයතනයක සේවා පළපුරුද්ද සහ ඉංග්‍රිසි භාෂාවෙන් වැඩකිරීමේ හැකියාව

## සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන

**සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (ඉංග්‍රීසි මාධ්‍යය) ආරම්භ කිරීම**

සමාජ වැඩ පිළිබද ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (2019/2020) ශාස්ත්‍රපති උපාධි වැඩසටහන 2019 ජූලි 5 වන දින ජාතික සමාජ සංවර්ධන ආයතනයේ දී ආරම්භ විය. දැනුම ලබා ගැනීමේ සිට විශ්ලේෂණාත්මක කුසලතා වර්ධනය කිරීම, විවේචනාත්මක ඇගයීම සහ විවේචනාත්මක විමසීම් තුළින් දැනුම නිෂ්පාදනය කිරීම සඳහා ගුණාත්මක වෙනසක් ඇතුළත් වන පරිදි සමාජ වැඩ පිළිබඳ උසස් දැනුමක් ලබා දීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත. සමාජ සුභසාධන අංශයන්හි සේවය කිරීම සඳහා වෘත්තීය සුදුසුකම් ලත් කළමනාකරුවන් සහ සමාජ වැඩ ක්‍ෂෙත්‍රයේ දක්ෂ මිනිස්බල නිපදවීම මඟින් සමාජ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම එහි අරමුණයි.

මෙම වැඩසටහන පන්ති කාමර පාඩම් වලින් සමන්විත වන අතර එයට ප්‍රධාන වශයෙන් දේශන, ශිෂ්‍ය ඉදිරිපත් කිරීම්, සම්මන්ත්‍රණ සාකච්ඡා, තෝරාගත් සමාජ හා ආශ්‍රිත සංවිධාන අධ්‍යයන නිරීක්ෂණ චාරිකා ඇතුළත් වේ. වෘත්තිකයින්ට සහ කළමනාකරණ තනතුරු දරන පුද්ගලයින්ගේ නායකත්වය ගුණාංග දියුණු කිරීමද මෙමඟින් සිදු කරනු ලැබේ.

**ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව**

ශාස්ත්‍රපති උපාධිය 2019/2019 (සිංහල හා දෙමළ මාධ්‍ය) ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ අධ්‍යයන අවශ්‍යතාවයක් ලෙස සිදු කරන ලදි. මේ සඳහා ශිෂ්‍යයන් 27 දෙනෙකු සහ පීඨ සාමාජිකයින් 03 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව 2019 පෙබරවාරි 08 සහ 09 යන දිනවල පවත්වන ලදී. එය මෙම කණ්ඩායම පල්ලකලේවිවෘත බන්ධනාගාරය, අම්බේපුස්ස "ප්‍රබෝධ" මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථානය සහ අම්පිටිය බිහිරි පාසල වෙත ගියහ.

## සමාජ වැඩ පිළිබඳ උපාධි පාඨමාලාව

### හැඳින්වීම

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව පූර්ණ කාලීන සිව් අවුරුදු වැඩසටහනකි. පන්ති කාමර පාඩම්, ස්ථානීය ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රම සහ ක්ෂේත්‍ර පුහුණු අ◌ැතුළත් අධ්‍යයන වාර අටකින් පවත්වනු ලැබේ. සිව් අවුරුදු අධ්‍යයන කාලය තුළ ක්ෂේත්‍ර පුහුණු දෙකක් (2 සහ 4 වසර වලදී) පවත්වනු ලැබේ. මෙම ක්ෂේත්‍ර ස්ථානගත කිරීම් දෙකෙහිදී, පුහුණුව ලත් වෘත්තීය සමාජ සේවකයින්ගේ සමීප අධීක්ෂණය යටතේ සිසුන් ප්‍රජාවන්හි සහ ආයතනවල පුහුණු◌ෙව්. ස්ථානගත කිරීම් පූර්ණ කාලීන වන අතර සති විසිහතරක කාලයක් තුළ පවත්වනු ලැබේ. මෙම වෘත්තීය පාඨමාලාව තුළින් අපේක්‍ෂා කරනු◌ෙය් අවශ්‍යතා ඇති පුද්ගලයින් සමඟ වැඩ කරන කැපවූ වෘත්තිකයින් බිහි කිරීමයි.

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියට අදාළ විෂය නිර්දේශය මගින් සමාජ විද්‍යාව සහ සමාජ වැඩ ක්‍රමවෙද පිළිබඳ පුළුල් දැනුමක් ලබා දේ. ක්ෂේත්‍ර පුහුණුව තුළින් සිසුන් ප්‍රජා ක්‍රියාකාරකම් සඳහා මැදිහත් වන අතර ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා සකස් කිරීම අනිවාර්ය වේ. එසේම ඔවුන් පර්යේෂණ වාර්තාවක් සකස් කළ යුතුය.

මෙම පාඨමාලාවේ විශේෂත්වය වන්නේ න්‍යායාත්මක දැනුම ලබා දෙන පැය ගණනට වඩා ක්ෂේත්‍ර පුහුණුව සඳහා පැය ගණනක් තිබීමයි. මෙම පාඨමාලාවට ඇතුළත් වීමේ සුදුසුකම වන්නේ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමයි. (මේ සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති සුදුසුකම් සිසුන්ට ලබයි) ඉහළම ලකුණු ලබා ඇති සිසුන්ට පාඨමාලාවට ඇතුළත් විය හැකිය.

සමාජ වැඩ පිළිබඳ උපාධිය 2013 වසරේ සිට භාෂා තුනෙන්ම (සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ) පවත්වනු ලබන අතර දෙවන වසරේ සිසුන්ට තම මව් භාෂාවෙන් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් දේශන සඳහා සහභාගී විය හැකිය. සිංහල හා දෙමළ භාෂාවෙන් පාඨමාලාව හදාරන අයට ඉංග්‍රීසි දැනුම නඟා සිටුවීමට උපකාරී වන විභාගයකට මුහුණ දෙන අතර ශිෂ්‍යයා ඉහළම ලකුණු ලබා ගන්නේ නම්, ඔවුන්ට මෙම පාඨමාලාව තෙවන වසරේ සිට ඉංග්‍රීසි◌ෙයන් හැදෑරිය හැකිය.

### ඇතුළත් වීමේ සුදුසුකම්

සමාජ වැඩ උපාධිය සඳහා පාඨමාලාවේ පළමු වසර සඳහා අපේක්ෂකයින් ඇතුළත් කිරී◌ෙම්දී පහත කරුණු සලකා බලනු ලැබේ;

අ.) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම්
සහ
ආ.) ඉංග්‍රීසි පිළිබඳ මනා දැනුමක් *

සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව සම්පූර්ණ කර ඇති අපේක්ෂකයින් පාඨමාලාවේ දෙවන වසර සඳහා ඇතුළත් කර ගැනීම සඳහා සලකා බලනු ලැබේ.

අ.) සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාවෙන් කුසලතා සමත් වීම සහ
ආ.) ඉංග්‍රීසි පිළිබඳ මනා දැනුමක්

බඳවා ගැනීමේ මට්ටම් දෙකෙහිම සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට ප්‍රවේශ විභාගය සඳහා පෙනී සිටීමට ඇතුළත් වීමේ කමිටුව විසින් නියම කළ හැකිය. මෙම ප්‍රවේශ විභාගයට සුදුසුකම් ඇති අය සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. අවසාන අපේක්ෂකයින් තෝරා ගැනීම කුසලතා මත පදනම්ව සිදු වේ.

**වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය - 2019**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය 2019 මාර්තු 22 වන දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) පැවැත්විණි. ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සහභාගී විය. ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍ය දයා ගමගේ මහතා ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීමේ රාජ්‍ය අමාත්‍ය අලි සහීර් මවුලානා සෙයිඩ්, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ ලේකම් එච්. එම්. ගාමිණි සෙනරත් මහතා හා ආරාධිත සම්මන්ත්‍රණ දේශනය ඕස්ට්‍රේලියාවේ කර්ටන් විශ්ව විද්‍යාලයේ සමාජ වැඩ විද්‍යාලයේ මහාචාර්ය මහාචාර්ය ඩොනල්ඩ් චන්ද්‍රරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

මෙම උත්සවයේදී සමාජ වැඩ ශාස්ත්‍රවේදී (BSW) සහ සමාජ වැඩ ශාස්ත්‍රපති (MSW) උපාධිධාරීන්ට උපාධි ප්‍රදානය කරන ලදී. ඩිප්ලෝමා සම්මාන උළෙලේදී සිසුන් 337 දෙනෙකුට ඔවුන්ගේ ඩිප්ලෝමා සහතිකය හිමි විය.



**ලෝක සමාජ වැඩ දිනය - 2019 -"සැමරුම් පාගමන"**

2019 ලෝක සමාජ වැඩ දින තේමාව "මානව සබඳතාවල වැදගත්කම ප්‍රවර්ධනය කිරීම" යන්නයි. මෙම දිනෙය්දී ලොව පුරා සිටින සමාජ සේවකයින් වෘත්තියේ ජයග්‍රහණ සැමරීම, සමාජ වැඩ දායකත්වයන් පිළිබඳව දැනුවත් කිරීම සහ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ ඔවුන්ගේ ප්‍රජාවන්, සේවා ස්ථාන සහ රජයන් දැනුවත් කිරීම සිදු කරනු ලැෙබ්.

ශ්‍රී ලංකාවේ සමාජ වැඩ පිළිබඳ පුරෝගාමී අධ්‍යාපන සැපයුම්කරු ලෙස ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් 2019 මාර්තු 18 වන දින ලෝක සමාජ දිනය සැමරීම සඳහා පාගමනක් සංවිධානය කෙළ්ය. මෙම "සැමරුම් පාගමන" උදෑසන 9.00 ට කොළඹ විහාරමහදේවි උද්‍යානයේ සිට ආරම්භ විය. ගරු. ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍ය දයා ගමගේ මහතා ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍ය අලි සහීර් මවුලානා සෙයිඩ්, ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) ෂාමිණි අත්තනායක මහත්මිය, ශ්‍රී ලංකා වෘත්තීය සමාජ සේවකයින්ගේ සංගමයේ සභාපති රණවීර මහතා. මෙම වැදගත් අවස්ථාවට සමාජ වැඩ සිසුන්, NISD හි අධ්‍යක්ෂවරුන් සහ කාර්ය මණ්ඩලය, සමාජ වැඩ වෘත්තිකයන් සහ විවිධ ක්ෂේත්‍රවල නියැලී සිටින වෘත්තීය සමාජ සේවකයින් ද සහභාගී විය. මෙම පාගමන පෙරවරු 11.00 ට පමණ ශ්‍රී ලංකා පදනමේ (ශ්‍රී ලංකා නිදහස් පෙරමුණ) අවසන් විය.

**ග්‍රාමීය කඳවුර - 2019**

සමාජ වැඩ විද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් අතරින් ග්‍රාමීය කඳවුරු තුළින් ශිෂ්‍යයාට මානව වාසභූමි පිළිබඳ අත්දැකීම් ලබා ගත හැකිය. සමාජ වැඩ පිළිබඳ උපාධිය 2016/2020 කණ්ඩායම සිය දින 10 ග්‍රාමීය කඳවුර දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී සාර්ථකව නිම කරන ලදී. අවශ්‍යතා තක්සේරු විශ්ලේෂණය සඳහා ග්‍රාම නිලධාරී කොට්ඨාශ 18 ක උපාධි අපේක්ෂකයින් 32 දෙනෙකු අනුයුක්ත කර ඇත. ඔවුන්ගේ සොයා ගැනීම් ඉදිරිපත් කිරීම 2019 අප්‍රේල් 03 වන දින ප්‍රධාන බලධාරීන් වෙත භාර දෙන ලදී

**දුම්රිය සහ හරිත සංකල්පය**

BSW 2018/2019 හි සිසුන් 2019 පෙබරවාරි 23 වන දින උදේ 9.00 සිට දහවල් දක්වා සිය ව්‍යාපෘතිය වන දුම්රිය සහ හරිත සංකල්පය සාර්ථකව නිම කරන ලදී. මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වූයේ හරිත සමාජ වැඩ තුළින් පිරිසිදු රාජ්‍ය සේවාවක් ලබා දීමය. හරිත සමාජ වැඩ පිළිබඳ දැනුවත් කිරීමක් ඇති කරමින් කොටුව දුම්රිය ස්ථානයේදී නාට්‍ය හා පෝස්ටර් ඉදිරිපත් කිරීම සාර්ථකව පැවැත්විණි. ඊට අමතරව දුම්රිය සහ හරිත සංකල්පයහි Facebook පිටුවක් ද පවත්වාගෙන යනු ලැබේ.

**Helping Hand ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසලක සමාජ ෙස්වා විද්‍යාලෙය් ශිෂ්‍යයකු විසින් දියත් කරන ලදී. ශිෂ්‍ය නායකත්ව කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් මෙම දෙදින ව්‍යාපෘතිය අළුත්වැව මධ්‍යම මහා විද්‍යාලයේ දී පවත්වන ලදී. පාසල් පුස්තකාලයට පොත් පරිත්‍යාග කරන ලද අතර අඩු ආදායම්ලාභී පවුල්වල තෝරාගත් සිසුන්ට පාසල් භාණ්ඩ පරිත්‍යාග කරන ලදී. පාසැල් භූමිය තුළ ගස් සිටුවීමේ ව්‍යාපාරයක් ද දියත් කරන ලදී. සිසුන්, ගුරුවරුන් සහ ප්‍රජාව අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පාසල් ප්‍රජා සම්බන්ධතා ප්‍රවේශය භාවිතා කරන ලදී.

## සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

**හැඳින්වීම**

ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන සමාජ වැඩ උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ අරමුණ වන්නේ සමාජ සේවා, සමාජ සුබසාධන හා සමාජ සංවර්ධන ක්ෂේත්‍රයන් සඳහා අවශ්‍ය විද්‍යාත්මක දැනුම, කුසලතා හා සමාජ වැඩ මැදිහත්වීම පිළිබඳ දැනුම ලබා දීමයි. ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් විවිධ උසස් ඩිප්ලෝමා පාඨමාලා පවත්වනු ලබයි. ඒ අතර සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (අවු 02 දෙමළ හා ඉංග්‍රිසි මාධ්‍ය) සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (අවු 01 සිංහල, දෙමළ හා ඉංග්‍රිසි මාධ්‍ය) සංඥා භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (අවු 01 සිංහල හා දෙමළ මාධ්‍ය) හැඳින්විය හැකිය. මෙම පාඨමාලාවන්හි ඉගෙනුම් ක්‍රියාවලිය පන්තිභාර දේශන, ක්ෂේත්‍ර මුහුණු අභ්‍යාස හා වර්තමාන සිද්ධි ඇසුරින් ඉගනිම ඇසුරින් සකස් වී ඇත. ක්ෂේත්‍ර පුහුණු අධ්‍යාපන කාලසීමාව තුලදී ශිෂ්‍යයන් විවිධ ප්‍රජාවන් හා ආයතන තුළ සමාජ වැඩ ක්‍රියාත්මක කිරීම. සමාජ වැඩ විෂය පිළිබඳ මනා දැනුමක් සහිත වෘත්තීය සමාජ වැඩ කරුවන්ගේ අධීක්ෂණය යටතේ සිදු කරයි. මෙම වෘත්තීය පාඨමාලාව ශිෂ්‍යයන් අවශ්‍යතා සහිත පුද්ගලයන් හඳුනාගෙන ක්‍රියාවලියක් තුලින් එම අවශ්‍යතා වලට මැදිහත් වීම පිළිබඳ දැනුම ලබා දෙයි.

**ඇතුලත්වීමේ සුදුසුකම්**

- අපොස උසස් පෙළ සමත් වීම. ( විශ්ව විද්‍යාල ප්‍රෙවිශයට අදාළ අවම සුදුසුකම් සපුරා තිබීම)
- වෙනත් පිළිගත හැකි උසස් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
- රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක (තෝරාගත්) අවු 03 සේවය.

**සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2019 ක්‍රියාකාරකම්**

**සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සමාරම්භය (2019/2020)**

මෙම පාඨමාලාවේ සමාරම්භක උත්සවය 2019 ජුනි මස 11 වන දින අධ්‍යක්ෂ ජනරාල් හා අතිරේක අධ්‍යක්ෂක ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් ජාතික සමාජ සංවර්ධන ආයතනයේදී පවත්වන ලදී.

වැඩසටහන සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් ලබා දෙනු ඇත. රාජ්‍ය නිලධාරීන් සහ සමාජ වැඩ ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් වෘත්තිකයිනගේ සේවා සැලසුම තුළ ඔවුන්ගේ අධ්‍යාපනය හා පුහුණුව වැඩි දියුණු කිරීම සපුරාලීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත. සිසුන්ගෙන් බහුතරයක් සමාජ වැඩ සහ ඒ ආශ්‍රිත අංශවන රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවලට අයත් අයයි. දැනට, පන්ති කාමර ඉගැන්වීම සිදු වෙමින් පවතී.

**ග්‍රාමීය කඳවුර**

සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමාව (2018/2019) කණ්ඩායම 2019 අගෝස්තු 3 වන දින හතරලියැද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටි ඔවුන්ගේ ග්‍රාමීය කඳවුර (මානව වාසභූමි වල සේවා සැපයීම) සාර්ථකව නිම කරන ලදී. (සිංහල හා දෙමළ) මාධ්‍යයන්හි සිසුන් හතළිස් අට දෙනෙකු (48) මෙම කඳවුරට සහභාගී වූ අතර ඔවුන් ක්ෂේත්‍රය තුල දින 10 ක් ඒම ප්‍රදේශීය ලේකම් කාර්යාලයට අදාළ ගැටළු විමර්ශන කරමින් ගත කරන ලදී . අවසන් ඉදිරිපත් කිරීම හතරලියැද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වන ලදි. මහනුවර දිස්ත්‍රික්කයේ සහකාර දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, හතරලියාද, ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) සහ සමාජ සේවා විද්‍යාලයේ අධ්‍යක්‍ෂ සහභාගී වූවන් අතර විය.

**අධ්‍යයන චාරිකාව**

සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ 2019/2020 සිසුන්ට ඇති ප්‍රථම වසර පළමු අධ්‍යයන චාරිකාවේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා අනුරාධපුර සහ වව්නියා හි සුභසා සංවිධාන නිරීක්ෂණ කිරීම පැමිණියහ. මෙම සංචාරයට සිංහල හා දෙමළ මාධ්‍ය සිසුන් යන දෙපරිසම "පීඨ සාමාජිකයින්" සමඟ සහභාගී වූහ. මෙම අධ්‍යයන චාරිකාව 2019 ඔක්තෝබර් 06 සිට ඔක්තෝබර් 11 දක්වා පවත්වන ලදී

**සමාජ සේවා විද්‍යාලය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ වෙනත් ක්‍රියාකාරකම්**

- **Journal ලිවීම පිළිබඳ වැඩමුළුව**

Journal ලිවීම පිළිබඳ වැඩමුළුව ජාතික සමාජ සංවර්ධන ආයතනයේ දී 2019 ජුනි මස 04 වන දින පවත්වන ලදී. මෙම වැඩසටහන RMIT විශ්ව විද්‍යාලයේ මහාචාර්ය රොනී විසින් සිසුන් සහ සමාජ සේවා විද්‍යාලයේ පීඨ සාමාජිකයින් සඳහා පවත්වන ලදී. මෙම සැසිවාරයේ මෙහෙයවීම ජැස්මින් පෙරේරා මහත්මිය විසින් සිදු කළාය.

- **සමාජ වැඩ පිළිබඳ ආසියා පැසිෆික් සමුළුව**

සමාජ වැඩ පිළිබඳ ආසියා පැසිෆික් සමුළුව (APSWC 2019) 2019 සැප්තැම්බර් 16 සිට සැප්තැම්බර් 20 දක්වා ඉන්දියාවේ බෙංගාලෝරුවේදී පැවැත්විණි. ඒහිදී ජාතික සමාජ සංවර්ධන ආයතනය නියෝජනය කරමින් සමාජ සේවා විද්‍යාලයේ පීඨ සාමාජිකයින්ගෙන් සහ පුහුණු අංශයේ පීඨ සාමාජිකයින් දෙදෙනෙකු මෙම සමුළුවට සහභාගී වූ අතර ඔවුන් විවිධ සමාජ වැඩ කේෂ්ත්‍ර අත්දැකීම් හා සම්බන්ධ තේමාවන් පිළිබඳ පර්යේෂණ ලිපි ඉදිරිපත් කළහ.

***සහභාගී වූවන් :*** ගෞරී වාසුදේවන් මිය (අධ්‍යක්ෂ පුහුණු අංශය)

ඉෂාරි ගුණරත්න මිය (සමාජ සේවා විද්‍යාලය )

මධු මුණසිංහආරච්චි මිය (සමාජ සේවා විද්‍යාලය )

නිරෝෂණී හේරත් මිය (සමාජ සේවා විද්‍යාලය )

සුබෝධනී හේරත් මිය (සමාජ සේවා විද්‍යාලය )

කුමුදුනී වැදිසිංහ මිය (පුහුණු අංශය)

- **පාසල් සමාජ වැඩ පිළිබඳ ජාත්‍යන්තර සංගමය**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ (වැ.බ) ෂාමිණී අත්තනායක මහත්මිය, "2020 දශකයේ සහ ඉන් ඉදිරියට සමාජ වැඩකරුවන්ගේ භූමිකාව සහ ස්ථානය" යන තේමාව ඔස්සේ 2019 නොවැම්බර් 7-8 වන දිනයන්හි 4 වන ජාත්‍යන්තර පාසල් සමාජ වැඩ සම්මේලනයට (IASSW) රුමේනියාවේ, බුකාරෙස්ට් හි දී සහභාගීවිය.

- **ප්‍රසිද්ධ දේශනයන්**

''ශ්‍රී ලංකිකයන් විසින් ඕස්ට්‍රේලියාවේ ආරක්ෂාව සෙවීම'' යන මැයින් සමාජ සේවා විද්‍යාලය විසින් 2019 නොවැම්බර් 22 වන දින ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ශ්‍රවනාගාරයේ දි පොදු දේශනයක් සංවිධානය කරන ලදි. මෙම දේශනය පවත්වන ලද්දේ ඕස්ට්‍රේලියාවේ කර්ටන් විශ්වවිද්‍යාලයේ විශ්‍රාමලත් මහාචාර්ය ඩොනල්ඩ් චන්ද්‍රරත්න විසිනි. මෙම අවස්ථාව සඳහා කාර්යමණ්ඩල සාමාජිකයන්, ක්ෂේත්‍ර ක්‍රියාකාරීන්, ස්වෙච්ඡා සමාජ වැඩකරුවන්, සමාජ වැඩ උපාධිධරයන් සහ වෙනත් වෘත්තීමය පිරිස් සම්බන්ධ වන ලදී.

- **සමාජ ප්‍රතිපත්ති පිළිබඳ වැඩමුළුව**

2019 නොවැම්බර් 21 වන දින ඕස්ට්‍රේලියාවේ කර්ටන් විශ්වවිද්‍යාලයේ විශ්‍රාමලත් මහාචාර්ය ඩොනල්ඩ් චන්ද්‍රරත්න විසින් සමාජ ප්‍රතිපත්ති පිළිබඳ එක්දින වැඩමුළුවක් ආයතනික සම්මන්ත්‍රණ ශාලාවේදි පවත්වන ලදි. මේ සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන අංශ ත්‍රිත්වයෙහි කාර්ය මණ්ඩලය සහභාගි විය.

**උපාධිධාරින් විසින් ලබා ගන්නා ලද රැකියා අවස්ථාවන්**

රාජ්‍ය අංශයේ රැකියා
- සමාජ වැඩ උපදේශන, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- රේගු නිලධාරින්
- සංවර්ධන සහකාර
- පරිවාස නිලධාරි
- ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි
- උපදේශකවරුන්
- ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපන සේවය
- මනෝවිද්‍යා සමාජ වැඩ උපදේශන

පෞද්ගලික අංශයෙහි සමාජ වැඩ වෘත්තිකයන් සඳහා රැකියා අවස්ථා බොහෝමයක් හිමිවන අතර දේශීය අන්තර්ජාතික වශයෙන් එහිදි හමු වූ විශිෂ්ඨතම අවස්ථාවන් මෙසේ දැක්විය හැකිය.

- ව්‍යාපෘති කළමනාකරණ නිලධාරි
- සංවර්ධන නිලධාරි
- උපදේශකවරුන්

රාජ්‍ය නොවන සංවිධාන
- සමාජ වගකීම් සම්බන්ධිකාරකවරුන්
- මානව සම්පත් කළමනාකාර නිලධාරි

මෙයට අමතරව බෙහෝ ශිෂ්‍යයන් නොරාඩ්, USAID, පොදුරාජ්‍ය මණ්ඩලීය සහ ඉන්දියානු රාජ්‍ය ශිෂ්‍යත්වයන් ලබා විවිධ රාජ්‍යයන්හි අධ්‍යාපන කටයුතුවල නිරත වෙමින් සිටි.

# පුහුණු අංශය



## හැඳින්වීම

2004 වර්ෂයේදී ස්ථාපනය කරනු ලැබූ පුහුණු අංශය, ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ආයතනික ව්‍යුහයේ ප්‍රධාන අංශ හතර අතුරින් එකක් වශයෙන් හැඳින්විය හැකිය. මෙම අංශය පුහුණු කිරීමේ අධ්‍යක්ෂකවරියක යටතේ ක්‍රියාත්මක වේ. 2019 වර්ෂයේ දී ජ්‍යෙෂ්ඨ පුහුණු කිරීමේ නිළධාරිනියන් දෙදෙනෙකු සහ දෙවන ශ්‍රේණියේ පුහුණු කිරීමේ නිළධාරීන් / නිළධාරිනියන් 08 දෙනෙකු මෙම අංශය තුළ සේවය කරනු ලබයි. මීට අමතරව කළමණාකාර සහකාර I එක් නිළධාරිනියක්ද, කළමණාකාර සහකාර II නිළධාරිනියන් දෙදෙනෙකු, කළමණාකාර සහකාර III එක් නිළධාරියෙකු හා කාර්යාල සහායකවරයෙකු මෙම අංශයට අනුයුක්තව සේවය කරයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතට අනුව පුහුණු අංශයට පැවරී ඇති වගකීම් වනුයේ,

- සමාජ සුභසාධන ක්‍රම සහ සමාජ සංවර්ධන වැඩසටහන් පිළිබඳ අධ්‍යයන කටයුතු පැවැත්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම
- සමාජ වැඩ වලදී තාක්ෂණය උපයෝගී කරගැනීම ඇතුලුව සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපන ක්‍රමයෙහි නිර්මාණාත්මක පරිවයක් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම
- ඒ සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම
- සමාජ සුභසාධනයෙහි නිරත නිළධරයන් සහ වෙනත් කාර්ය මණ්ඩල සඳහා පුහුණුවීමේ පාඨමාලා සහ ශික්ෂණ වැඩසටහන් පවත්වාගෙන යාම

සමාජ සවිබලගැන්වීම්, සුභසාධන සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාශය මගින් යොමු කරනු ලබන අදාළ අංශයන්හි කාර්ය මණ්ඩල/සේවාලාභීන් සඳහා මානව සම්පත් සංවර්ධනය පදනම් කරගත් තේමාවන් පිළිබඳ පුහුණුව ලබාදීම මෙම අංශය මගින් සිදුකරනු ලබයි. එපමණක් නොව සංවර්ධනය හා සම්බන්ධ ක්ෂේත්‍රයන් හා බැඳුනු පුහුණු වැඩසටහන් මෙම අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර, වෙනත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සඳහාද පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. එසේම ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය වෙත බාහිර ආයතන මගින්ද පුහුණු වැඩසටහන් සඳහා බොහෝ ඉල්ලීම් ලැබේ. එබැවින් පුහුණු අංශය පුහුණු කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන හා ඒ ආශ්‍රිත ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් සංවිධානය කරනු ලැබේ.

**පුහුණු අංශයේ අරමුණු :**

1. විවිධ ක්ෂේත්‍රයන්හි සහ අදාළ අංශයන්හි පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම.
2. රටෙහි පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් ඊට අනුකූල වන පරිදි මානව සම්පත් පුහුණු කිරීම.
3. අවශ්‍යතා තක්සේරුව මගින් පුහුණු අවශ්‍යතා සහිත අංශ හඳුනා ගැනීම.
4. සේවාලාභීන්ගේ අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි පුහුණු වැඩසටහන් සංවිධානය සහ ක්‍රියාත්මක කිරීම.
5. පුහුණු වැඩසටහන් වලට අදාළ පාඨමාලා අන්තර්ගතයන් සංවර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම.

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය මගින් පුළුල් ක්ෂේත්‍ර ගණනාවක් පදනම් කරගනිමින් පුහුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. එහිදී දීර්ඝ කාලීන සහ කෙටි කාලීන පුහුණු වැඩසටහන් සහ පාඨමාලාවන් මෙන්ම අනෙකුත් වෘත්තිය පාඨමාලාද සංවිධානය කරනු ලැබේ. ඒ අතර සංවිධානය කරනු ලබන දීර්ඝ කාලීන පුහුණු වැඩසටහන් පහත ආකාර වේ.

- උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව
- උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- ළමා ආරක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- සමාජ රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- ප්‍රජාපාදක විශෝධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- ළමා පාදක ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- විශේෂ අධ්‍යාපනය ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

පුහුණු අංශය මගින් අවශ්‍යතාවය මත පදනම්ව පහත ආකාරයේ කෙටිකාලීන පුහුණු වැඩසටහන්ද සංවිධානය කරනු ලැබේ.

- උපදේශනය තුළ තක්සේරුකරණය
- ආතතිය සහ මනෝවිද්‍යාත්මක උපදේශනය
- අනපේක්ෂිත ගැබ්ගැනීම් සඳහා වූ උපදේශනය
- සමාජ භීතිකාව කළමණාකරණය කිරීම
- උපදේශන මැදිහත්කරණ ක්‍රමශිල්ප
- විශෝධන සේවා හා බැඳුනු උපදේශනය
- මත්ද්‍රව්‍ය සඳහා උපදේශනය
- අවධානමට ලක්වූවන් සඳහා නිවෙස් මගින් ලබාදිය හැකි සහාය
- මෘදු කුසලතා
- හරිත සමාජ වැඩ
- සමාජ වැඩ සඳහා මූලික කුසලතා
- සිද්ධි කළමණාකරණය සඳහා මූලික කුසලතා
- පවුල් සමඟ වැඩ කිරීම සඳහා මූලික කුසලතා
- කණ්ඩායම් සමඟ වැඩ කිරීම සඳහා මූලික කුසලතා
- ප්‍රජාව සමඟ වැඩ කිරීම සඳහා මූලික කුසලතා
- නායකත්වය

- කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත සමාජ වැඩ
- ගැටුම් කළමණාකරණය
- සමාජ රැකවරණය
- වැඩ පරිසරය සහ සාමාන්‍ය ජීවිතය සමබරකරගැනීම සඳහා ජීවන කුසලතා
- ළමා සංවර්ධනය
- විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වෙනුවෙන් කරන මැදිහත්කරණය සඳහා සමාජ වැඩ මැදිහත්කරණය
- ව්‍යාපෘති ලිවීම සඳහා වැඩමුලුව
- ප්‍රජා ව්‍යාපෘති කළමණාකරණය සඳහා වැඩමුලුව
- වැඩිහිටි රැකවරණය සඳහා උපදේශන මැදිහත්කරණය
- දුගීබව අවම කිරීමේ ක්‍රමෝපාය සහ තිරසාර ජීවිකා සංවර්ධනය
- ගැටුම් නිරාකරණය සඳහා ප්‍රජා සංවර්ධනය සහ ප්‍රජා මූල කළමණාකරණය

එසේම පහත ආකාරයේ අතුරු වෘත්තිය පාඨමාලාද මෙම අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

- ප්‍රජා මූල සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ ධාරිතාව ගොඩනැංවීමේ පුහුණු වැඩසටහන

## 2019 වර්ෂය තුළ පුහුණු අංශය මගින් පැවැත්වූ පාඨමාලා සහ පුහුණු වැඩසටහන්

**ඩිප්ලෝමා පාඨමාලා**

### 1. උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

**හැඳින්වීම**

උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව, සති අන්ත අධ්‍යයන පාඨමාලාවක් වශයෙන් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ඩිප්ලෝමා පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිකන නිර්දේශයන්ට අනුකූල වන පරිදි කොළඹ මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගනිමින් සැලසුම්කොට පවත්වාගෙන යයි.

**ඉලක්කය**

දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සැකැස්ම සහිත මනා පරිචයන්ගෙන් යුතු වෘත්තීය උපදේශකවරුන් බිහිකිරීම

**අරමුණු**

- උපදේශන ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක බවින් හෙබි වෘත්තිකයන් බිහිකිරීම.
- උපදේශන වෘත්තිකයන්ගේ උසස් වෘත්තීය කුසලතා පුළුල් කිරීම.
- උපදේශන වෘත්තිකයාගේ මැදිහත්වීමේ හැකියාව වර්ධනය කිරීම.

**මාධ්‍යය**

සිංහල සහ දෙමළ

**කාල සීමාව**

මාස 21කි. මෙම පාඨමාලාවෙහි මාස 03ක උපදේශන පුහුණුවක් අන්තර්ගත වේ. (සති අන්ත පාඨමාලාවකි)

**පාඨමාලා ව්‍යුහය**

(සම්පූර්ණ සම්මාන ඒකක (credit) 30කි, දේශන - පැය 405 සහ ක්ෂේත්‍ර පුහුණුව - පැය 150). ඒ අනුව මුළු පැය ගණන පැය 555කි.

උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව පහත සංරචකයන්ගෙන් සමන්විත විය.

- පාඨමාලා ඒකක 09
- ක්ෂේත්‍ර පුහුණුව

## 2019 වර්ෂය තුළ උසස් ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වූ ස්ථාන

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ කොළඹ ප්‍රධාන මධ්‍යස්ථානය කේන්ද්‍ර කොට ගනිමින් 2019.01.27 වන දින මෙම පාඨමාලාව ආරම්භ කර ඇත.

## 2. උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

**හැඳින්වීම**

උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය විසින් සති අන්ත අධ්‍යයන පාඨමාලාවක් වශයෙන් පිරිනමනු ලැබේ. මෙම පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිකන නිර්දේශයන්ට අනුව (SLQF) අනුකූලවන පරිදි සකස්කර ඇත.

**ඉලක්කය**

දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සැකැස්ම සහිත මනා පරිචයන්ගෙන් යුතු වෘත්තීය උපදේශකවරුන් බිහිකිරීම

**අරමුණු**

- උපදේශන ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක බවින් හෙබි වෘත්තිකයන් බිහිකිරීම
- උපදේශන වෘත්තිකයන්ගේ උසස් වෘත්තීය කුසලතා පුළුල් කිරීම
- උපදේශන වෘත්තිකයාගේ මැදිහත්වීමේ හැකියාව වර්ධනය කිරීම

**මාධ්‍යය**

සිංහල/දෙමළ/ඉංග්‍රීසි

**කාල සීමාව**

මාස 21කි. මෙම පාඨමාලාවේ මාස 03ක උපදේශන පුහුණුවක් අන්තර්ගත වේ. (සති අන්ත පාඨමාලාවකි)

**පාඨමාලා ව්‍යුහය**

(සම්පූර්ණ සම්මාන ඒකක (credit) 30කි, දේශන - පැය 405 සහ ක්ෂේත්‍ර පුහුණුව - පැය 135). ඒ අනුව මුලු පැය ගණන පැය 540 කි.

උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව පහත අංගයන්ගෙන් සමන්විත වේ.

- විෂය ඒකක 09
- ක්ෂේත්‍ර පුහුණුව
- අධ්‍යයන චාරිකාව

## 2019 වර්ෂය තුළ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වූ ස්ථාන

1. ජාතික සමාජ සංවර්ධන ආයතනය, කොළඹ ප්‍රධාන මධ්‍යස්ථානය
2. ජාතික සමාජ සංවර්ධන ආයතනය, කොළඹ, තලාව සහ රන්න මධ්‍යස්ථාන(සමෘද්ධි නිළධාරීන් සඳහා)
3. තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානය
4. අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානය
5. අම්පාර (කාරිතිවු) ප්‍රාදේශීය සභාව
6. මඩකලපුව පළාත් සභා පරිපාලන මධස්ථානය
7. නුවර ජාතික සමූපකාර ආයතනය
8. යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

9. කිලිනොච්චිය ප්‍රාදේශීය මධ්‍යස්ථානය
10. ත්‍රිකුණාමලය සමාජ සේවා දෙපාර්තමේන්තුවේ පළාත් කාර්යාලය
11. රත්නපුර, මාතර, කුරුණෑගල (ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරීන් සඳහා)

## 3. වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

### හැඳින්වීම

වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව නිර්මාණය කරන ලද්දේ වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණයට අදාල ක්ෂේත්‍ර තුළ තම වෘත්තීය සංවර්ධනය ඇති කර ගැනීමට අපේක්ෂිත පුද්ගලයින්, දැනටමත් මෙම ක්ෂේත්‍රයතුළ රැකියාවෙහි නියලෙන, තම වෘත්තීය මාවත පුළුල් කරගැනීමට අපේක්ෂිත පුද්ගලයින් පදනම් කරගෙනය. වයස්ගත වෙමින් පවතින සමාජය විසින් නිර්මාණය කරනු ලබන නව අවස්ථාවන්ට අනුරූපීයව අර්ථාන්විත වෘත්තීය වෙනස්කම් ඇති කිරීමේ අරමුණින් මෙම පාඨමාලාව පිරිනමනු ලැබේ. අන්තර්විෂයික පාඨමාලාවක් වශයෙන් මෙය සම්පූර්ණ කිරීමේදී, ශිෂ්‍යයින් විසින් දීර්ඝකාලීන හා සෞඛ්‍යය සම්පන්න ජීවිතයක් ගතකිරීම සඳහා ගැටලු විසඳීම සහ කුසලතා ඇතිකිරීමට අවැසි අවශ්‍යතාවන්ගෙන් සන්නද්ධ කරවීම අපේක්ෂිතය. වැඩිහිටි රැකවරණ සේවා ක්ෂේත්‍රය තුළ ශිෂ්‍යයින්, තනි පුද්ගල වෘත්තීය මාවත සංවර්ධනය කර ගැනීමට මෙය උපකාරී වේ.

වෘද්ධ විද්‍යාව හා වැඩිහිටිරැකවරණය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන ශ්‍රී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිකන නිර්දේශයන්ට අනුකූල වන පරිදි (SLQF) සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ තත්ත්ව පරීක්ෂණ ඒකකය (Quality Assurance Unit) පිළිබඳ අවධානය යොමු කරමින් අර්ධකාලීන වැඩසටහනක් වශයෙන්, ශ්‍රී ලංකාව මගින් පිරිනමනු ලබන ජාතික සහ ජාත්‍යන්තරව පිළිගත් සුදුසුකම් සැකසීමේ අරමුණින් වර්ධනය කර ඇත.

### ඉලක්කය

දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සැකැස්ම සහිත මනා පරිචයන්ගෙන් යුතු වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය විෂයෙහි කටයුතු කිරීමට බලාපොරොත්තුවන විද්වද් වෘත්තිකයන් පිරිසක් බිහි කිරීම හා මෙම ක්ෂේත්‍රයේ වැඩකිරීමට කැමැත්තක් දක්වන පුද්ගලයින්ගේ සිය වෘත්තිය ධාරිතාව සංවර්ධනය කිරීම.

### අරමුණු

- රැකබලා ගන්නන්ගේ ක්ෂේත්‍රය තුළ ගුණාත්මක බවින් පිරි වෘත්තිකයන් බිහිකිරීම
- වැඩිහිටියන් පිළිබඳ ක්ෂේත්‍රයේ නියැලෙන වෘත්තිකයන්ගේ වෘත්තීය කුසලතා පුළුල් කිරීම
- වෘත්තිකයන්ගේ මැදිහත්වීමේ හැකියාව වර්ධනය කිරීම

**මාධ්‍යය :** සිංහල

**කාල සීමාව :** මාස 18

**පාඨමාලා ව්‍යුහය :**
(සම්පූර්ණ සම්මාන ඒකක (credit) 30කි, දේශන- පැය 405 සහ ක්ෂේත්‍ර පුහුණුව- පැය135). ඒ අනුව මුලු පැය ගණන පැය 540කි.පහත මූලිකාංගයන්ගෙන් වෘද්ධ විද්‍යාව සහ වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සමන්විත වේ.

- විෂය ඒකක 10
- ක්ෂේත්‍ර පුහුණුව

**2019 වර්ෂය තුළ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වෙන ස්ථාන**

1. වැඩිහිටි මහලේකම් කාර්යාලය - කොළඹ

**සහතිකපත්‍ර පාඨමාලා**

## 1. උපදේශනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

- **උපදේශනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව - NAITA**

**හැඳින්වීම**

උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව තුළින් අවධානය යොමු කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ මානසික සෞඛ්‍යය සහ මානසික යහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා අතුරු වෘත්තිකයන්ගේ කුසලතා වර්ධනය කිරීම පිළිබඳවය. මෙය ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රමිති සංරක්ෂණ සහ පැවරීමේ කවුන්සිලය මගින් නිර්මාණය කරන ලද සුදුසුකම් සැලැස්ම මත පදනම් වෙමින් නිර්මාණය කොට ඇත.

**ඉලක්කය**

උපදේශනය සහ සමාජ සුභසාධනය සඳහා අවශ්‍ය දැනුම, කුසලතා, ආකල්ප සහ පුහුණුව සහිත වෘත්තිකයන් සහ අතුරු වෘත්තිකයන් ප්‍රජා මට්ටම තුළ සැපයීම

**අරමුණු**

- උපදේශනය සඳහා ගුණාත්මක බවින් යුතු අතුරු වෘත්තිකයන් සැපයීම
- සේවාලාභීන්ට අවශ්‍ය වන අතුරු වෘත්තීය කුසලතා පුලුල් කිරීම
- යොමු කිරීමේ සේවාවන් සඳහා නිළධාරීන් සහ සේවා සපයන්නන්ට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම

**මාධ්‍යය :** සිංහල

**පාඨමාලා කාලය :** මාස 06 යි. (දේශන පැය 150 යි. ක්ෂේත්‍ර පුහුණුව පැය 100 යි). මුලු පැය ගණන පැය 250යි.

**පාඨමාලා ව්‍යුහය :** පහත මූලිකාංගයන්ගෙන් පාඨමාලාව සමන්විත වේ.

- විෂය ඒකක 06
- ක්ෂේත්‍ර පුහුණුව

**2019 වර්ෂය තුළ සහතිකපත්‍ර පාඨමාලාව පැවැත්වූ ස්ථානය**

1. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය - රාජගිරිය.

**පුහුණු අංශය මඟින් මානව සම්පත් සංවර්ධනය සඳහා පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන්**

**1.** සමාජ සවිබලගැන්වීම් සුභසාධන හා කන්ද උඩරට උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ උපදේශන සහකාර නිලධාරීන් හා කාන්තා කටයුතු හා ළමා සංවර්ධන අමාත්‍යාංශයේ උපදේශන නිලධාරීන් හා උපදේශන සහකාර නිලධාරීන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා වූ සේවාස්ථ පුහුණුව - මූල්‍ය හා තාක්ෂණික අනුග්‍රහය ආසියානු පදනම.

සමාජ සවිබලගැන්වීම් සුභසාධන හා කන්ද උඩරට උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ උපදේශන සහකාර නිලධාරීන් හා කාන්තා කටයුතු හා ළමා සංවර්ධන අමාත්‍යාංශයේ උපදේශන නිලධාරීන් හා උපදේශන සහකාර නිලධාරීන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය තුළින් ඔවුන්ගේ සේවාලාභීන්ටත් පොදුවේ ප්‍රජාවටත් ගුණාත්මක සේවාවක් සැපයීම මෙම වැඩසටහනේ පරමාර්ථය වන අතර ඒ තුළ පහත අරමුණු ද අන්තර්ගතය,

- උපදේශන නිලධාරීන්ගේ හා උපදේශන සහකාර නිලධාරීන්ගේ සේවා සැපයීමට අදාළ දැනුම හා කුසලතා වර්ධනය කිරීම.
- අමාත්‍යාංශ දෙකෙහිම උපදේශන ක්ෂේත්‍රයට අදාළ වෘත්තිකයන් සඳහා පොදු වූ වෘත්තීය පදනමක් සකස් කිරීම.
- පුරුෂයින් සඳහා උපදේශන සේවාවන් සැපයීමට අවශ්‍ය උපදේශන නිපුණතා වර්ධනය කිරීම.

මෙම පුහුණු වැඩසටහන 2019 පෙබරවාරි මස 14 දින සිට අගොස්තු මස 09 වන දින දක්වා දිවයිනේ සියලු ම පළාත් ආවරණය වන පරිදි වැඩසටහන් 13 ක් යටතේ පහත දිස්ත්‍රික්කයන්හි දී නිලධාරීන් 368 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

**වගු අංක 05**

**දිස්ත්‍රික් අනුව පුහුණු පාඨමාලා පැවැත්වීම**

| අනු අංකය | දිස්ත්‍රික්කය | සහභාගී වූ පුහුණුවන්නන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කොළඹ | 24 |
| 02 | කොළඹ | 31 |
| 03 | ගාල්ල | 33 |
| 04 | යාපනය | 27 |
| 05 | නුවර | 32 |
| 06 | නුවර | 34 |
| 07 | රත්නපුර | 29 |
| 08 | බදුල්ල | 14 |
| 09 | කුරුණෑගල | 41 |
| 10 | කුරුණෑගල | 16 |
| 11 | මාතර | 29 |
| 12 | මඩකලපුව | 41 |
| 13 | හම්බන්තොට | 17 |

පුහුණු අංශය මගින් පවත්වනු ලැබූ සේවාස්ථ පුහුණු වැඩ සටහන් වගු අංක 5 මගින් දක්වා ඇති අතර දිස්ත්‍රික්ක 13ක් ආවරණය වන පරිදි මෙම වැඩසටහන් පවත්වා ඇත.

**2. වෘත්තීය මාර්ගෝපදේශන දිනය වෙනුවෙන් ගාල්ල සවුත්ලන්ඩ් විද්‍යාලයේ පැවැත්වූ වැඩසටහන**

2019.01.20වනදින ගාල්ල සවුත්ලන්ඩ් විද්‍යාලයේදී වෘත්තීය මාර්ගෝපදේශන දිනය නිමිත්තෙන් පුහුණු වැඩසටහනක් පැවැත්වූ අතර, එහිදී ජාතික සමාජ සංවර්ධන ආයතනය පිළිබඳ හැඳින්වීම සහ අප ආයතනය විසින් සංවිධානය කරනු ලබන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් පිළිබඳ හැඳින්වීම සිදු කරන ලදි. මේ සඳහා එම විද්‍යාලයේ පාසල් සිසුන් සහ ආචාර්ය මණ්ඩලයේ 400 දෙනෙකු සහභාගිවිය.

**3. ක්ෂේත්‍ර පරීක්ෂක පුහුණු වැඩසටහන**

**අම්පාර සහ රන්න පුහුණු මධ්‍යස්ථානයේ පැවති වැඩසටහන්**

උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා හදාරන සිසුන්ගේ ක්ෂේත්‍ර පුහුණුව අධීක්ෂණය කරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂකවරුන් පුහුණු කිරීමේ අරමුණින් මෙම වැඩසටහන පවත්වන ලදි. ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන, උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා හා ඩිප්ලෝමා පාඨමාලාවන්හි ශිෂ්‍ය අධීක්ෂණ කටයුතු වල නිරත වන ජ්‍යෙෂ්ඨ උපදේශන නිලධාරීන්හට ශිෂ්‍ය අධීක්ෂණ කටයුතු පිළිබඳව දැනුවත් කිරීම හා ක්ෂේත්‍ර මොඩියුල පිළිබඳ අවබෝධය ලබාදීමේ අරමුණින් මෙම වැඩසටහන් පවත්වන ලදි. 2019.09.26 දින කොළඹ ප්‍රධාන මධ්‍යස්ථානයේදී 35 දෙනෙකුගේ සහභාගිත්වයෙන්ද, 2019.12.10 දින රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී 14 දෙනෙකුගේ සහභාගීත්වයෙන්ද, 2019.11.26දින අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී සිංහල මාධ්‍යයෙන් 17දෙනෙකුගේ සහභාගීත්වයෙන්ද 2019.10.24 දින දමිළ මාධ්‍යයෙන් 35කගේ සහභාගීත්වයෙන්ද, 2019.12.10දින තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී 20දෙනෙකුගේ සහභාගීත්වයෙන්ද, 2019.10.11දින කිලිනොච්චි ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී 20දෙනෙකුගේ සහභාගීත්වයෙන්ද, 2019.10.29දින දමිළ මාධ්‍යයෙන් මඩකලපුව ප්‍රාදේශීය රජයේ මධ්‍යස්ථානයේදී 38දෙනෙකුගේ සහභාගීත්වයෙන්ද පවත්වන ලදි.

වාර්ෂිකව මෙවැනි වැඩසටහනක් පැවැත්වීම තුළ ක්ෂේත්‍ර අධීක්ෂණය පිළිබඳ උපදේශන නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය වන බව පුහුණුලාභීන්ගේ අදහස විය. තවද ශිෂ්‍ය ක්ෂේත්‍ර අධීක්ෂණය තුළ මතුවන ප්‍රායෝගික ගැටලු සහ අභියෝග විවෘත සාකච්ඡාවට ලක් කිරීමට අවශ්‍ය පසුබිම වැඩසටහන හරහා අවකාශ සැලසෙන බව ඔවුන්ගේ අදහස විය. පුහුණු අංශය මගින් ක්ෂේත්‍ර මොඩියුල සම්බන්ධයෙන් කෙරෙන සංශෝධනයන් පිළිබඳව විධිමත් අවබෝධය ලබාගැනීමට මෙමඟින් අවකාශ සැලසුණි.

මනෝ විද්‍යාත්මක උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ ක්ෂේත්‍ර කටයුතු විධිමත් කිරීම සම්බන්ධයෙන් පැවැත්වෙන මෙම වැඩමුළුව, සෑම වසරකදීම ඉතාමත් සාර්ථක අයුරින් සිදුකෙරෙන අතර එහිදී ජ්‍යෙෂ්ඨ උපදේශකවරුන්ගේ දැනුම තවදුරටත් දියුණු කිරීම හා ගැටලු සහගත අවස්ථාවන් නිරාකරණය කරගැනීම සඳහා අවස්ථාව ලබාදෙන්නකි. ක්ෂේත්‍ර කටයුතු පිළිබඳව නව දැනුම සහ ක්‍රමවේදයන් පිළිබඳ අවබෝධය මෙම වැඩසටහන තුළ ලබාදෙන අතර එම දැනුම ශිෂ්‍ය ක්ෂේත්‍ර අධීක්ෂණයේදී භාවිතාවට ගැනීමට උපදෙස් ලබාදෙයි. ඒ හරහා අවසාන වශයෙන් නිලධාරීන්හට සාර්ථක ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතු වල නිරතවීමට හා තම වෘත්තීය සංවර්ධනයට අවස්ථාව උදාවේ.

## 4. ප්‍රජා පාදක සංවිධාන නායකයින් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - සුහුරු ගම්මාන වැඩසටහන

2019 වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම ආයතනයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන වන තලාව, රන්න, අම්පාර සහ කිලිනොච්චිය යන ස්ථාන 04 කේන්ද්‍ර කර ගනිමින් සුහුරු ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. පහත අරමුණු පදනම් කර ගනිමින් මෙය පවත්වන ලදී.

**ව්‍යාපෘතියේ අරමුණු :**

- ප්‍රජාවේ සමස්ත සංවර්ධනයට අදාළ නිපුණතා සංවර්ධනය කිරීම
- ඒකාබද්ධ සේවා සැපයුමක් සඳහා ප්‍රජා නියෝජිතයන්ගේ හා සේවා පද්ධතීන් අතර සම්බන්ධතාවය ගොඩනැගීම
- සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රජාවේ ඇති සීමාවන් සහ බාධක දුරලීම සඳහා නිපුණතා සංවර්ධනය කිරීම
- ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යනිකයන්ගේ සහ ශිෂ්‍යයන්ගේ ක්ෂේත්‍ර අත්දැකීම් ප්‍රවර්ධනය කිරීම

මෙකී දීර්ඝ කාලීන අරමුණු සාධනය සඳහා තුන් අවුරුදු සැලැස්මක් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වූ අතර එහි පළමු පියවර වශයෙන් අදාළ ක්ෂේත්‍රයට අනුගත වෙමින් ඔවුන්ගේ අවශ්‍යතා බිම් මට්ටමින් හඳුනා ගැනීම අරමුණු කර ගෙන මෙම වර්ෂය තුළ ප්‍රජා පාදක සංවිධාන නායකයින් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

**වගු අංක 06**
**ප්‍රජා පාදක පුහුණු වැඩසටහන්**

| දිනය | ස්ථානය | පුහුණු වැඩසටහන | සංඛ්‍යාව |
|---|---|---|---|
| 2019.03.29 සහ 30 | රන්න, අඳුපැලැන ගම්මානය | ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නිලධාරීන් සඳහා වැඩසටහන (අවශ්‍යතා හඳුනා ගැනීම.)<br>සමෘද්ධි ප්‍රතිලාභීන්, ළමා වැඩසටහන් හා උප ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 42 |
| 2019.03.25 සහ 26 | තලාව, කුරුඳු වැව ගම්මානය | ග්‍රාමීය ප්‍රජා මූල සංවිධාන, කුඩා කණ්ඩායම් සඳහා වැඩසටහන<br>දහම් පාසල් ළමුන්, ගුරුවරුන් හා පෙර පාසල් දරුවන් සඳහා වැඩසටහන | 25 |
| 2019.04.01 සහ 02 | අම්පාර, සද්ධාතිස්ස ප්‍රාථමික විද්‍යාලය | දෙමාපියන් දැනුවත් කිරීම, ග්‍රාමීය ප්‍රජා මූල සංවිධාන නිලධාරීන්, ප්‍රජා නායකයින්, කාන්තා සමිති දැනුවත් කිරීම. | 37 |
| 2019.04.08 සහ 09 | කිලිනොච්චිය, මරුදනගර් ගම්මානය | ග්‍රාමීය ප්‍රජා මූල සංවිධාන නිලධාරීන්, කුඩා කණ්ඩායම් ළමුන්, තරුණ ප්‍රජාව දැනුවත් කිරීම. | 41 |

පුහුණු අංශය මගින් ප්‍රජා පාදක සංවිධාන නායකයින් පුහුණු කිරීම රන්න, තලාව, අම්පාර, කිළිනොච්චිය ප්‍රාදේශීය මධ්‍යස්ථාන මූලික කරගෙන පවත්වා ඇති අතර ඒ පිළිබඳ විස්තර වගු අංක 06 යටතේ ඉදිරිපත් කර ඇත.

**වගු අංක 07**
**පුහුණු අංශය විසින් 2019 වර්ෂයේදී පවත්වන ලද පුහුණු සහ අධ්‍යයන වැඩසටහන්**

| | ක්‍රියාකාරකම | වෙන්කරන ලද ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.) | භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | ව්‍යාපෘති සංඛ්‍යාව |
| | | | | ස්ත්‍රී | පුරුෂ | |
| 01. | වෘත්තීය මාර්ගෝපදේශන දිනය නිමිති කරගෙන ගාල්ල සවුත්ලන්ඩ් විදුහලේ පවත්වන ලද වැඩසටහන (රන්න මධ්‍යස්ථානය) | 0.45 | | 400 | | 01 |
| | ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - ප්‍රජා මූලික සංවිධාන නායකයින් (රන්න මධ්‍යස්ථානය) | | 32,636.00 | 42 | | 01 |
| | ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - ප්‍රජා මූලික සංවිධාන නායකයින් (තලාව මධ්‍යස්ථානය) | | 26,940.00 | 25 | | 01 |
| | ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - ප්‍රජා මූලික සංවිධාන නායකයින් (අම්පාර මධ්‍යස්ථානය) | | 30,305.00 | 37 | | 01 |
| | ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - ප්‍රජා මූලික සංවිධාන නායකයින් (කිලිනොච්චිය මධ්‍යස්ථානය) | | 31,565.00 | 41 | | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 02 | පුහුණු නාමාවලියක් සකස් කිරීම | 983,632.00 | 17,825.00 | 12 | 01 |
| | පුහුණු නාමාවලිය | | 491,815.60 | | 01 |
| 03 | පාඨමාලාවන් අවසන් කරන ලද සිසුන් සම්බන්ධව සිදුකරනු ලබන ප්‍රගතිය පිළිබඳ වැඩසටහන | 1,000,000.00 | | | 01 |
| 04 | ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (කොළඹ) | 0.25 | 46,865.00 | 27 | 01 |
| | ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (කිලිනොච්චිය) - දෙමළ මාධ්‍යය | | 44,172.00 | 19 | 01 |
| | ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (අම්පාර) - දෙමළ | | 68,345.00 | 35 | 01 |
| | ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (තලාව) | | 20,820.00 | 10 | 01 |
| | ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (අම්පාර) - සිංහල | | 17,415.00 | 11 | 01 |
| | ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (රත්න) - සිංහල | | 29,039.00 | 14 | 01 |
| 05 | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන - මානසික සෞඛ්‍ය දින වැඩසටහන (කිලිනොච්චිය) | 0.1 | 22,760.00 | 50 | 01 |
| | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන - මානසික සෞඛ්‍ය දින වැඩසටහන (තලාව) | | 21,903.00 | 55 | 01 |
| | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන - මානසික සෞඛ්‍ය දින වැඩසටහන (අම්පාර) | | 21,050.00 | 76 | 01 |
| | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන - මානසික සෞඛ්‍ය දින වැඩසටහන (රත්න) | | 22,081.00 | 100 | 01 |

පුහුණු අංශයේ වැඩ කටයුතු නාවල ප්‍රධාන මධ්‍යස්ථානය පදනම් කරගනිමින් සිදුවන අතර, පුහුණු අංශය සතුව ප්‍රාදේශීය මධ්‍යස්ථාන 04ක් දීප ව්‍යාප්තව තිබේ. එම ප්‍රාදේශීය මධ්‍යස්ථාන තුල පාඨමාලා මෙන්ම පුහුණු වැඩසටහන් එම ප්‍රාදේශීය ප්‍රජාවන් පදනම් කරගනිමින් සිදු කරන ලද අතර එය වගු අංක 07 මගින් දක්වා ඇත.

## අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානය

**01. ක්‍රියාත්මක දිගුකාලින පුහුණු පාඨමාලාවන්**

**වගු අංක 08**

**ක්‍රියාත්මක දිගුකාලින පුහුණු පාඨමාලාවන්**

| අනු අංකය | පාඨමාලාව/ වැඩසටහන | කාලය | ප්‍රතිලාභින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | උපදේශනය පිළිබද ඩිප්ලෝමා පාඨමාලාව 2017 /19 සිංහල මාධ්‍යය | මාස 21 කි | සිසුන් 31 දෙනකි |
| 02 | උපදේශනය පිළිබද ඩිප්ලෝමා පාඨමාලාව 2017 /19 දෙමළ මාධ්‍යය | මාස 21 කි | ඒ කණ්ඩායමේ සිසුන් 46 දෙනකි<br>බී කණ්ඩාමේ සිසුන් 53 දෙනකි |
| 03 | උපදේශනය පිළිබද ඩිප්ලෝමා පාඨමාලාව 2019 /20 සිංහල මාධ්‍යය | මාස 21 කි | සිසුන් 42 කි |

**02. අම්පාර ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ වාර්ෂික සැලැස්මට අනුව 2019 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද කෙටි කාලීන පුහුණු වැඩසටහන්**

**වගු අංක 09**

| වැඩසටහන/වැඩසටහන් මාතෘකාව | සහභාගිත්වය | පවත්වන ලද දිනය | ස්ථානය | වියදම (රු) | |
|---|---|---|---|---|---|
| 01.අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය සංවිධානයන්හි නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය කිරීමේ දෙදින පුහුණු වැඩසටහන | කාන්තා ග්‍රාම සංවර්ධන සමිති නිලධාරින් 39 දෙනෙක් | 2019.04. 01 සහ 02 | ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානය | සංග්‍රහ | 24365.00 |
| | | | | ලිපිද්‍රව්‍ය | 1790.00 |
| | | | | සහතික | 4000.00 |
| | | | | සම්පත් දායක දීමනා හා ප්‍රවාහන වියදම් | - |
| | | | | **එකතුව** | **30155.00** |
| 02. ක්ෂේත්‍ර උපදේශක වරුන් දැනුවත් කිරිමේ එක් දින පුහුණු වැඩසටහන | ක්ෂේත්‍ර උපදේශන නිලධාරින් 15 දෙනක් | 2019.11. 29 | ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානය | සංග්‍රහ | 6415.00 |
| | | | | ලිපිද්‍රව්‍ය | - |
| | | | | සහතික | - |
| | | | | සම්පත් දායක දීමනා හා ප්‍රවාහන වියදම් | 11000.00 |
| | | | | **එකතුව** | **17415.00** |

අම්පාර පුහුණු මධ්‍යස්ථානය මූලික කරගෙන පවත්වනු ලබන දිගුකාලීන හා කෙටිකාලීන පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තරය වගු අංක 08 හා 09 මගින් දක්වා ඇත.

**03. ප්‍රදේශයේ රාජ්‍ය රාජ්‍ය නොවන සහ ප්‍රජා සංවිධානයන්ගේ ඉල්ලීම අනුව වැඩසටහන් 24 ක් සඳහා සම්පත් දායකත්වය සපයන ලදී.**

**04. සේවාලාභින් 21 හට මනෝ උපදේශන සේවාවන් සපයන ලදී.**

**වර්ෂයේ ආදායම් හා වියදම් විස්තරය**

**වගු අංක 10**

**අම්පාර ප්‍රාදේශීය අදායම් හා වියදම් විස්තරය**

| ආදායම් විස්තරය | වටිනාකම (රුපියල්) |
|---|---|
| 2018/19 උපදේශන ඩිප්ලෝමා පාඨමාලාවේ පාඨමාලා ගාස්තු හා ලියාපදිංචි ගාස්තු | 1,600,000.00 |
| 2019 /20 උපදේශන ඩිප්ලෝමා පාඨමාලාවේ පාඨමාලා ගාස්තු හා ලියාපදිංචි ගාස්තු | 2,040,000.00 |
| **එකතුව** | **3,640,000.00** |
| | |
| මුදල් අය නොකළ සපයන ලද සේවාවන්හි වටිනාකම<br>(ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා)<br>නේවාසික වීම්<br>දේශනශාලා ලබා දීම්<br>මල්ටි මීඩියා යන්ත්‍ර ලබා දීම | <br><br>3,900.00<br>144,000.00<br>105,000.00 |
| **එකතුව** | **252,900.00** |

| වියදම් විස්තරය | වටිනාකම (රුපියල්) |
|---|---|
| ජලය | 17,870.78 |
| විදුලිය | 20,663.05 |
| දුරකතන | 26,021.06 |
| පරිපාලන | 7,086.00 |
| **එකතුව** | **71,640.89** |

අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ 2019 වර්ෂයට අදාල අදායම් හා වියදම් විස්තරය වගු අංක 10 යටතේ දක්වා ඇත.

**ප්‍රාදේශීය වශයෙන් සම්පත් දායකත්වය සපයන ලද වැඩසටහන්**

**1.** වැඩසටහන - **ගර්භණී මාතාවන්ගේ මානසික සුවතාවය වර්ධනය කරලීම**

සංවිධානය - උහන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය
දිනය - 2019.02.24
සහභාගිත්වය - මව්වරුන් 40 දෙනෙකි

**අරමුණු**

- ගර්භනී මාතාවන් මුහුණපාන මානසික සෞඛ්‍ය ගැටලු හඳුනා ගැනීම
- ගර්භනී මාතාවන්ගේ මානසික සෞඛ්‍යය ඉහළ නැංවීම

**2.** වැඩසටහන - **ප්‍රජා පොලිස් නිළධාරින්ගේ ආකල්ප සංවර්ධන වැඩසටහන**

සංවිධානය - නැගෙනහිර පළාත් පොලිස් සේවස්ථ පුහුණු ආයතනය
දිනය - 2019.03.25
සහභාගිත්වය - ප්‍රජා පොලිස් ඒකක නිළධාරින් 40

අරමුණු
- ප්‍රජා පොලිස් ඒකකයේ සේවයේ නියුතු නිළධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය
- ඔවුන් තුළ ඉහළ සේවාවක් සැපයීම සඳහා ආකල්ප සංවර්ධනය
- ප්‍රජා පොලිස් නිළධාරීන් හා ප්‍රජාව අතර සම්බන්ධතාවය සංවර්ධනය කිරීම

**3. වැඩසටහන - මනෝ විද්‍යා උපදේශනය හා එහි වැදගත්කම**

සංවිධානය - කොණ්ඩුවටුවාන යුධ හමුදා සටන් පුහුණු පාසල
දිනය - 2019.01.28
සහභාගිත්වය - යුධ, ගුවන් හා නාවුක හමුදා නිළධාරින් 35 කි.

අරමුණු
- යුධ, ගුවන් හා නාවුක හමුදා නිළධාරීන්ගේ උපදේශනය පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම
- මෙම නිළධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා මනෝවිද්‍යාත්මක උපදේශනයේ ඇති වැදගත්කම පැහැදිලි කිරීම

**4. වැඩසටහන - ප්‍රජා සංවර්ධනය සඳහා ප්‍රජා අවශ්‍යතා තක්සේරු කිරිම**

සංවිධානය - දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය/ ග්‍රාම ශක්ති ව්‍යාපෘතිය
දිනය - 2019.03.06
සහභාගිත්වය - ක්ෂේත්‍ර නිළධාරින් 55 ක්.

අරමුණු
- දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පවතින ප්‍රජා අවශ්‍යතා හඳුනා ගැනීම
- එම ප්‍රදේශයේ සේවයේ නියුතු ක්ෂේත්‍ර නිළධාරීන් විසින් මෙම ප්‍රජා අවශ්‍යතා තෘප්ත කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කිරීම
- ක්ෂේත්‍ර නිළධාරීන් මුහුණපාන වෘත්තීය ගැටලු සාකච්ඡා කිරීම හා ඒවා සඳහා ප්‍රායෝගික විසඳුම් සාකච්ඡා කිරීම

**5. වැඩසටහන - මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයන් හී ළමුන්ගේ චිත්තවේග කළමනාකරණය**

සංවිධානය - මහඔය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය
දිනය - 2019.02.07
සහභාගිත්වය - පෙර පාසල් ගුරුවරියන් 46 කි

අරමුණු
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන් මුහුණපාන චිත්තවේගීමය ගැටලු හඳුනා ගැනීම
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන්ගේ චිත්තවේග කළමණාකරණය සඳහා පෙර පාසල් ගුරුවරුන්ගේ කාර්යභාරය පැහැදිලි කිරීම

**6. වැඩසටහන - සිද්ධි කළමනාකරණය හා සිද්ධි සම්මන්ත්‍රණය**

සංවිධානය - අම්පාර දිසත්‍රික් ලේකම කාර්යාලය
දිනය - 2019.01.24
සහභාගිත්වය - අම්පාර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන් 22 හීළමුන් හා කටයුතු කරනු ලබන ක්ෂේත්‍ර නිළධාරින් 36

**අරමුණ**

- අම්පාර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන් 22හි ළමුන් හා කටයුතු කරනු ලබන ක්ෂේත්‍ර නිළධාරින් තුළ සිද්ධි කළමණාකරණය හා සිද්ධි සම්මන්ත්‍රණය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම

**7. වැඩසටහන - ග්‍රාමීය ළමාරක්ෂක කමිටු නිළධාරින්ගේ ධාරිතා සංවර්ධනය**

සංවිධානය - සියඹලාණ්ඩුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය
දිනය - 2019.03.07
සහභාගිත්වය - ළමුන් හා කටයුතු කරනු ලබන ක්ෂේත්‍ර නිළධාරින් හා ග්‍රාමීය ළමා රක්ෂක කමිටු සාමාජිකයින් 68 ක්

**අරමුණ**

- ළමුන් හා කටයුතු කරනු ලබන ක්ෂේත්‍ර නිළධාරින් හා ග්‍රාමීය ළමා රක්ෂක කමිටු සාමාජිකයින් තුළ ධාරිතා සංවර්ධනය

**8. වැඩසටහන - පෙර පාසල් සිසුන්ගේ චිත්තවේග කළමනාකරණය කුසලතා**

සංවිධානය - සියඹලාණ්ඩුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය සභාව
දිනය - 2019.03.15
සහභාගිත්වය - සියඹලාණ්ඩුව පෙර පාසල් ගුරු සංගම් සාමාජිකයින් 58

**අරමුණු**

- සියඹලාණ්ඩුව පෙර පාසල් ගුරු සංගම් සාමාජිකයින් වෘත්තීය හා පෞද්ගලික ජීවිතය තුළ මුහුණපාන මනෝවිද්‍යාත්මක ගැටලු අවබෝධ කර ගැනීම
- ඔවුන් මුහුණපාන මනෝවිද්‍යාත්මක ගැටලු සඳහා විසඳුම් සාකච්ජා කිරීම
- පෙර පාසල් ගුරු සංගම් සාමාජිකයින්ගේ චිත්තවේග කළමණාකරණය පිළිබඳ අවබෝධය ලබාදීම

**9. වැඩසටහන - සේවාලාභින්හට ඵලදායි සේවාවක් සැපයිම සඳහා සඵලදායි සන්නිවේදන කුසලතා**

දිනය - 2019.09.12
ස්ථානය - අම්පාර නගර සභා කාර්යමණ්ඩලය,
සහභාගිත්වය - 26

**අරමුණු**

- අම්පාර නගර සභා කාර්යමණ්ඩල සාමාජිකයින් තුළ සන්නිවේදන කුසලතා සංවර්ධනය කිරීම
- අම්පාර නගර සභා කාර්යමණ්ඩලය මගින් සපයන සේවා කාර්යක්ෂම කිරීම

**10. වැඩසටහන- සිද්ධි කළමනාකරණ කුසලතා (ළමුන් සමග වැඩ කරන රාජ්‍ය නිලධාරින් හා ප්‍රජා නායකයින් දැනුවත් කිරිමේ වැඩසටහන)**

දිනය - 2019.07.29
ස්ථානය - සියඹලාණ්ඩුව සංස්කෘතික මධ්‍යස්ථානය,
සහභාගිත්වය - 44

**අරමුණ**

- ළමුන් සමග වැඩ කරන රාජ්‍ය නිලධාරින් හා ප්‍රජා නායකයින්ගේ සිද්ධි කළමණාකරණ කුසලතා සංවර්ධනය කිරීම

**11. වැඩසටහන - ඌව පළාත් මුල් ළමාවිය සංවර්ධන නිලධාරින්ගේ ආකල්ප සංවර්ධනය හා ආතති කළමනාකරණ එකදින පුහුණු වැඩසටහන.**

දිනය - 2019.12.03
ස්ථානය - මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.
සහභාගිත්වය - ඌව පළාත්මුල් ළමාවිය සංවර්ධන නිළධාරින් 26

**අරමුණු**

- ඌව පළාත්මුල් ළමාවිය සංවර්ධන නිළධාරින්ගේ ආකල්ප සංවර්ධනය කිරීම
- ඌව පළාත්මුල් ළමාවිය සංවර්ධන නිළධාරින් තුළ ආතති කළමණාකරණය කිරීම

**12. වැඩසටහන - ආකල්ප සංවර්ධනය හා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබද එක්දින පුහුණු වැඩසටහන.**

දිනය - 2019.08.06
ස්ථානය - තිස්සපුර විහාරස්ථානය.
සහභාගිත්වය - සිවිල් ආරක්ෂක බලකා නිලධාරින් 79

**අරමුණු**

- සිවිල් ආරක්ෂක බලකා නිළධාරීන්ගේ ආකල්ප සංවර්ධනය කිරීම
- ඌව පළාත්මුල් ළමාවිය සංවර්ධන නිළධාරින්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම

**13. වැඩසටහන - කණ්ඩායම් උපදේශන කුසලතා**

දිනය - 2019.05.13
ස්ථානය - මොණරාගල සමුපකාර පුහුණු මධ්‍යස්ථානය
සහභාගිත්වය - ස්වේච්ඡා සමාජ සජීවිකාරකවරියන්

**අරමුණු**

- ස්වේච්ඡා සමාජ සජීවිකාරකවරියන් තුළ උපදේශනය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම
- ස්වේච්ඡා සමාජ සජීවිකාරකවරියන් තුළ කණ්ඩායම් උපදේශන කුසලතා සංවර්ධනය කිරීම

**14. වැඩසටහන - ළමා මනෝවිද්‍යාව**

දිනය - 2019.06.14
ස්ථානය - සියඹලාණ්ඩුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය
සහභාගිත්වය - පෙර පාසල් ගුරුවරුන් 69 දෙනෙකි

**අරමුණු**

- පෙර පාසල් ගුරුවරුන් තුළ ළමා මනෝවිද්‍යාව පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම
- පෙර පාසල් ගුරුවරුන්ගේ වෘත්තීය කාර්යභාරය සඳහා ළමා මනෝවිද්‍යාත්මක විෂයයේ ඇති වැදගත්කම පැහැදිලි කිරීම

**15. වැඩසටහන - ආතති කළමනාකරණය**

දිනය - 2019.11.08
ස්ථානය - අම්පාර මහ රෝහල
සහභාගිත්වය - වෛද්‍යවරුන්,හෙදියන් හා අනෙකුත් කාර්යමණ්ඩල 22

**අරමුණු**

- අම්පාර කාර්යය මණ්ඩලයේ සාමාජිකයින් මුහුණපාන මානසික ගැටලු හඳුනා ගැනීම
- ඔවුන්ගේ ආතති කළමණාකරණය

**16.** **වැඩසටහන - තරුණ කණ්ඩායම් බල සතුකිරිමේ ක්‍රමවේද හඳුන්වා දීම**

දිනය - 2019.07.24
ස්ථානය - බුත්තල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය
සහභාගිත්වය - තරුණ සංවිධාන නිළධාරීන් 28 දෙනෙක්

**අරමුණු**

- තරුණ සංවිධාන නිළධාරීන්ගේ දක්ෂතා හා කුසලතා හඳුනාගැනීම
- තරුණ සංවිධාන නිළධාරීන් සමාජගත කිරීම සඳහා ඔවුන් බලගතු කිරීම

**17.** **වැඩසටහන - පාසල් ශිෂ්‍ය නායක කුසලතා සංවර්ධන පුහුණු කඳවුර**

දිනය - 2019.07.24
ස්ථානය - පදියතලාව ජාතික පාසල
සහභාගිත්වය - පාසල් සිසුන් 280 දෙනෙක්

**අරමුණු**

- පාසල් සිසුන්ගේ කුසලතා හඳුනා ගැනීම
- එම කුසලතා සංවර්ධනය කිරීම සඳහා ක්‍රමවේද හඳුන්වා දීම
- ඔවුන් සතු කුසලතා ඵලදායී අයුරින් භාවිත කිරීම සඳහා ඔවුන් තුළම ස්වයං අවබෝධයක් ඇති කිරීම

**රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානය**

**වගු අංක 11**

**ඩිප්ලෝමා පාඨමාලා හා කෙටිකාලීන පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර**

| අනු අංකය | වැඩසටහනේ නම | පවත්වන ලද දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| **01** | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (සමෘද්ධි දෙපාර්තමේන්තුව) | 2018/2019 | 40 |
| **02** | ප්‍රජාමූල සමිති නායකයන් සඳහා ධාරිතා සංවර්ධනය පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන | 2019.03.29 හා 30 | 42 |
| **03** | අඳුපැලැන ග්‍රාමසේවා වසමේ සමිති ප්‍රජා මූල සමිති නායකයින් හමුවීපුහුණු අවශ්‍යතා හා ගැටළු හඳුනාගැනීමේ වැඩසටහන | 2019.09.04 | 27 |
| **04** | හ/කට්ටකඩුව මහ විදුහලේ සිසුන් සඳහා අධ්‍යාපන ඉලක්ක ජයගැනීම සඳහා අභිප්‍රේරණය මාතෘකාව ඔස්සේ කෙටි පුහුණු වැඩසටහන | 2019.10.10 | 51 |
| **05** | හ/කට්ටකඩුව මහ විදුහලේ ගුරුවරුන් සඳහා සිසුන් මුහුණ දෙන ගැටළු හඳුනාගැනීම හා උපදේශනය පිළිබඳව කෙටිපුහුණු වැඩසටහන | 2019.10.10 | 35 |
| **06** | සුහුරු ගම්මාන සංකල්පයට අනුව අඳුපැලැන ග්‍රාමසේවා වසමේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | 2019.10.10 | 100 |
| **07** | මානසික සෞඛ්‍ය දිනය වෙනුවෙන් පාසල් සිසුන්ගේ මානසික සෞඛ්‍ය සංවර්ධනය හා සියදිවි හානිකරගැනීම වැලැක්වීම පිළිබඳ වැඩසටහන | 2019.11.04 | 100 |
| **08** | ක්ෂේත්‍ර අධීක්ෂකවරු සඳහා ඒක්දින පුහුණු වැඩසටහන | 2019.12.10 | 15 |

**උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2018/2019**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හා කළමණාකරණ නිලධාරීන් 40 දෙනෙකු සඳහා පවත්වනු ලැබු උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව පවත්වා මේ වන විට සාර්ථකව අවසන් කර ඇත. ඒ පිළිබඳ විස්තර වගු අංක 11 යටතේ දක්වා ඇත.

**2019 වර්ෂයේ රන්න ප්‍රදේශීය මධ්‍යස්ථානය මඟින් ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන්**

1. **ප්‍රජාමූල සමිති නායකයින් සඳහා දෙදින පුහුණු වැඩසටහන**

**හැඳින්වීම** - හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාමීය ප්‍රජාමූල සමිතිවල නායකයින් ඉලක්ක කොට ගනිමින් මෙම වැඩසටහන පවත්වන ලදී.

- **වැඩසටහනේ නම** - ග්‍රාමීය ප්‍රජාමූල නායකයින් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන
- **සහභාගිවූවන්ගේ ස්වභාවය** - තංගල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාමසේවා වසම් ප්‍රජාමූල සමිති වල සභාපතිවරුන්, ලේකම්වරු හා භාණ්ඩාගාරික යන තනතුරුලාභින් 42 දෙනෙකු සහභාගී විය
- **සංවිධානය කරන ලද ආයතනය -** ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය
- **ඉල්ලීම කරන ලද ආයතනය -** තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- **සහභාගි වු ආයතන -** ගොවිජන සමිති**,** සණස සමිති, සමෘද්ධිසමිති, මරණාධාර සමිති, රන්න නැගෙනහිර සමෘද්ධි බැංකුව
- **දිනය** - 2019.03.29/30
- **දේශන මාතෘකා** - 2019.03.29 - ප්‍රජා සංවර්ධනය හැඳින්වීම හා ප්‍රජාමූල සංවිධාන වල වැදගත්කම - නායකත්ව හා සන්නිවේදන කුසලතා හා ප්‍රජාමූල සංවිධාන තුල ගැටුම් කළමනාකරණය
- **පුහුණු ක්‍රමවේදය** - පංති කාමර දේශන /කණ්ඩායම් සාකච්ඡා /ප්‍රායෝගික ක්‍රියාකාරකම්
- **සහභාගිවූවන්ගේ ඇගයිම්** - පුහුණු වැඩසටහන තුළින් තම ගම් ප්‍රදේශයේ ජනතාව වෙත වඩා හොඳ කාර්යක්ෂම සේවාවක් ලබාදිමට අවශ්‍ය දැනුම කුසලතා වැඩි දියුණු වු බව ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ප්‍රජා මූල සමිති තුළ මතුවන ගැටලු විසඳා ගැනිමට මෙම පුහුණුව තුළින් ලද දැනුම වැදගත් බැව් ප්‍රකාශ විය.
- **සහභාගිවූවන්ගේ නිගමන හා නිර්දේශ** - ඉතා යහපත් ප්‍රතිචාර ලැබුණු අතර මෙවැනි මාතෘකා ඔස්සේ තවත් වැඩසටහන් ලබාදෙන ලෙස ඉල්ලිම් ඉදිරිපත් කරන ලදී.
- **සම්පත් දායකත්වය** - පී.සී. හෙට්ටිආරච්චි මයා, බී.කේ.එස්. කරුණාරත්න මහතා හා රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ නිලධාරීන් සම්පත් දායකත්වය සපයන ලදී.

## 2. අඳුපැලැන ග්‍රාමසේවා වසමේ පවතින පුහුණු අවශ්‍යතා හා ගැටළු හඳුනා ගැනීම.

**හැඳින්වීම -** 2019 වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම ආයතනයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන වන රන්න, අම්පාර සහ කිලිනොච්චිය යන ස්ථාන 04 කේන්ද්‍ර කර ගනිමින් සුහුරු ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලදි. ඒ අනුව රන්න මධ්‍යස්ථානය කේන්ද්‍ර කර ගනිමින් තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමාජ ප්‍රශ්න සුලභ හා දුෂ්කරතා සහිත ගම්මානයක් වශයෙන් අඳුපැලැන ග්‍රාම නිළධාරි වසම තෝරාගන්නා ලදී. එම ගම්මානය සුහුරු ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සුදුසු ගම්මානයකක් වශයෙන් තෝරා ගන්නා ලද්දේ 2018 වර්ෂයේ පුහුණු අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද ප්‍රජා මූල සංවිධාන නායකයින් සඳහා පැවැත්වූ කෙටිකාලීන පුහුණු වැඩසටහනේ දී ලබාගත් දත්ත පාදක කරගනිමිනි. එමෙන්ම තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලබාගත් මූලාශ්‍රයන්ට අනුවද අඳුපැලැන ග්‍රාම නිළධාරි වසම තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇති දුෂ්කර ගම්මානයක් වශයෙන්ද හඳුනාගත හැකි විය. ඒ අනුව 2019 සුහුරු ගම්මාන ව්‍යාපෘතිය පහත අරමුණු ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කිරීමට ආරම්භ කරන ලදී.

**ව්‍යාපෘතියේ අරමුණු :**

- ප්‍රජාවේ සමස්ත සංවර්ධනයට අදාළ නිපුණතා සංවර්ධනය කිරීම
- ඒකාබද්ධ සේවා සැපයුමක් සඳහා ප්‍රජා නියෝජිතයන්ගේ හා සේවා පද්ධතීන් අතර සම්බන්ධතාවය ගොඩනැගීම
- සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රජාවේ ඇති සීමාවන් සහ බාධක දුරලීම සඳහා නිපුණතා සංවර්ධනය කිරීම
- ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යනිකයන්ගේ සහ ශිෂ්‍යයන්ගේ ක්ෂේත්‍ර අත්දැකීම් ප්‍රවර්ධනය කිරීම

මෙකී දීර්ඝ කාලීන අරමුණු සාධනය සඳහා තුන් අවුරුදු සැලැස්මක් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර එහි පළමු පියවර වශයෙන් අදාළ ක්ෂේත්‍රයට අනුගත වෙමින් ඔවුන්ගේ අවශ්‍යතා බිම් මට්ටමින් හඳුනාගැනීම අරමුණු කරගෙන අඳුපැලැන ග්‍රාමසේවා වසමේ ග්‍රාමසේවා නිළධාරි හා ප්‍රජාමූල සමිති වල නායකයින් ඇතුළු ගම්වාසීන් හමුවී ඒම වසමේ පවතින පුහුණු අවශ්‍යතා හා ගැටළු හඳුනාගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

### i. අඳුපැලැන ග්‍රාමසේවා වසමේ පවතින පුහුණු අවශ්‍යතා හා ගැටළු හඳුනා ගැනීමේ වැඩසටහන

- **වැඩසටහනේ නම -** අඳුපැලැන ග්‍රාමසේවා වසමේ පවතින පුහුණු අවශ්‍යතා හා ගැටළු හඳුනා ගැනීමේ වැඩසටහන
- **සහභාගිවූවන්ගේ ස්වභාවය -** ග්‍රාමසේවා නිළධාරි සහ ප්‍රජාමූල සමිති සාමාජිකයින් 27 සහභාගී විය.
- **සංවිධානය කරන ලද ආයතනය -** ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය
- **සහභාගි වූ ආයතන -** ගොවිජන සමිති,සණස සමිති, සමෘද්ධි සමිති ,මරණාධාර සමිති
- **දිනය -** 2019.09.04
- **දේශන මාතෘකා -** අඳුපැලැන ග්‍රාමසේවා වසමේ පවතින පුහුණු අවශ්‍යතා හා ගැටළු හඳුනා ගැනීම
- **පුහුණු ක්‍රමවේදය -** කණ්ඩායම් සාකච්ඡා /ප්‍රශ්නාවලි ඉදිරිපත් කිරීම්/ගැටලු ගස/බුද්ධිකලම්භන

- **සහභාගිවූවන්ගේ ඇගයීම් නිගමන හා නිර්දේශ-** සුහුරු ගම්මාන සංකල්පය වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අඳුපැලැන වැනි අති දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශයක තෝරා ගැනීම පිළිබඳව ඉතා අගය කොට සලකන ලදි.ඉතා යහපත් ප්‍රතිචාර ලැබුණු අතර අඳුපැලැන අති දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශයේදුප්පත්කම පිටුදකින වැඩසටහන්, මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවීම් වළක්වාලන වැඩසටහන්, පාසල් දරුවන් අධ්‍යාපනය ඉහළ නංවන වැඩසටහන්, තනිපවුල් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන්, උසස් පෙළ සමත් රැකියා විරහිත පුද්ගලයන් සඳහා වැඩසටහන්, තරුණයින් ඉලක්ක කරගත් සංවර්ධන වැඩසටහන්, අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්යනාදී වශයෙන් ගමට අවශ්‍යය පුහුණු අවශ්‍යතා මා වැඩසටහන්හඳුනාගන්නා ලදී.
- **සම්පත්දායකත්වය-** පී.සී.හෙට්ටිආරච්චි මයා, කාංචනා අධිකාරි මිය, බී. ජී. අයි. එම්. සමරසිංහ මිය හා රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ නිලධාරීන්සම්පත්දායකත්වය සපයන ලදී.

## ii. සිසුන් සඳහා අධ්‍යාපන ඉලක්ක ජයගැනීමේ වැඩසටහන

**හැඳින්වීම -** සුහුරු ගම්මාන සංකල්පයට අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රා.ලේ.කොට්ඨාශයට අයත් අඳුපැලැන ග්‍රාමයේ පාසල් දරුවන් වැඩි වශයෙන් අධ්‍යාපනය ලබනහ/සිද්ධාර්ථ මහ විදුහලේ පවුල් ඒකකය තුළ ආර්ථික හා සමාජීය වශයෙන් ගැටළු වලට බඳුන් වී ඇති විවිධ වයස් කාණ්ඩයන්හි (6 -11 ශ්‍රේණිය) තෝරා ගන්නා ලද සිසුන් කණ්ඩායමක් සඳහා අධ්‍යාපන ඉලක්ක ජය ගැනීම පිළිබඳව වැඩසටහනක් පවත්වන ලදි.මේ සඳහා සිසුන් 52 කු හා පාසලේ උපදේශන ගුරුවරයා සහභාගී විය.

- **වැඩසටහනේ නම -** සිසුන් සඳහා අධ්‍යාපන ඉලක්ක ජය ගැනීමේ වැඩසටහන
- **සහභාගිවූවන්ගේ ස්වභාවය -** හ/සිද්ධාර්ථ මහ විදුහලේ 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් 51 දෙනෙකු සහභාගී විය.
- **සංවිධානය කරන ලද ආයතනය -** ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය
- **ඉල්ලීම කරන ලද ආයතනය -** සුහුරු ගම්මාන වැඩසටහනෙහි අවශ්‍යතා තක්සේරුව අනුව හා හ/සිද්ධාර්ථ මහ විදුහලෙහි ගුරුවරුන්ගේ ඉල්ලීම මත
- **සහභාගි වූ ආයතන -** හ/සිද්ධාර්ථ මහ විදුහල
- **දිනය -** 2019.10.10
- **දේශන මාතෘකා -** අධ්‍යාපන ඉලක්ක ජය ගැනීම සඳහා සිසු අභිප්‍රේරණය
- **පුහුණු ක්‍රමවේදය -** පංති කාමර දේශන, කණ්ඩායම් සාකච්ඡා, ප්‍රශ්නාවලි ඉදිරිපත් කිරීම් සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම්
- **සහභාගිවූවන්ගේ ඇගයීම් නිගමන හා නිර්දේශ -** ඉතා යහපත් ප්‍රතිචාර ලැබුණු අතර මෙවැනි වැඩසටහන් පාසලට තවත් ලබා දෙන ලෙස සිසුනගේ ඉල්ලීම විය.මෙවැනි මාතෘකා ඔස්සේ පාසලේ සියලු ශ්‍රේණිවලදරුවන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්විය යුතු බව නිගමනය විය.
- **සම්පත්දායකත්වය -** පී.සී. හෙට්ටිආරච්චි මයා, කාංචනා අධිකාරි මිය, බී.ජී.අයි.එම්. සමරසිංහ මිය හා රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ නිලධාරීන් සම්පත්දායකත්වය සපයන ලදී.

### iii. සිසුන් මුහුණ දෙන අධ්‍යාපන ගැටළු හඳුනාගැනීම හා උපදේශනය

**හැඳින්වීම -** සුහුරු ගම්මාන සංකල්පයට අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රා.ලේ.කොට්ඨායට අයත් හ/සිද්ධාර්ථ මහ විදුහලේ සේවයේ නියුතු ගුරුභවතුන් සඳහා සිසුන් මුහුණ දෙන ගැටළු හඳුනාගනිමින් ඔවුන්ගේ අධ්‍යාපන ඉලක්ක ජයගැනිම සඳහා මනා මාර්ගෝපදේශයක් ලබාදෙන ආකාරය පිළිබඳව කෙටිපුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

- **වැඩසටහනේ නම -** සිසුන් මුහුණ දෙන අධ්‍යාපන ගැටළු හඳුනාගැනිම හා උපදේශනය
- **සහභාගිවූවන්ගේ ස්වභාවය -** හ/සිද්ධාර්ථ මහ විදුහලේ සේවයේ නියුතු ගුරුභවතුන් 33 දෙනෙකු සහභාගි විය.
- **සංවිධානය කරන ලද ආයතනය** - ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය
- **ඉල්ලීම කරන ලද ආයතනය -** සුහුරු ගම්මාන වැඩසටහනෙහි පුහුණු අවශ්‍යතා තක්සේරුව අනුව හා ගමෙහි දෙමාපියන්ගේ ඉල්ලීම මත.
- **සහභාගි වූ ආයතන - හ/සිද්ධාර්ථ මහ විදුහල**
- දිනය **- 2019.10.10**
- **පුහුණු ක්‍රමවේදය - පංති කාමර දේශන /කණ්ඩා යම් සාකච්ඡා /ප්‍රශ්නාවලි ඉදිරිපත් කිරිම්**
- **සහභාගිවූවන්ගේ ඇගයිම් හා නිගමන හා නිර්දේශ** - ඉතා යහපත් ප්‍රතිචාර ලැබුණු අතර ඒම වැඩසටහන මඟින් ඔවුන්ට තම ඉගැන්වීමේ ක්‍රමවේදය වඩාත් සාර්ථකව සිදුකිරිම සඳහා මනා පිටිවහලක් ලැබුණු බව ප්‍රකාශකර සිටින ලදි.මෙවැනි මාතෘකා ඔස්සේ තෙදින පුහුණු වැඩසටහන් පැවැත්විය යුතු බව නිගමනය විය.
- **සම්පත්දායකත්වය** - කාංචනා අධිකාරී මිය, බී.ජී.අයි.එම්.සමරසිංහ මිය හා රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ නිලධාරීන් සම්පත්දායකත්වය සපයන ලදී.

### iv. සුහුරු ගම්මාන සංකල්පයට අනුව අඳුපැලැන ග්‍රාමසේවා වසමේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන

**හැඳින්වීම** - සුහුරු ගම්මාන සංකල්පයට අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රා.ලේ.කොට්ඨායට අයත් අඳුපැලැන ග්‍රාමසේවා වසමේ ග්‍රාමසේවා නිළධාරි හා ප්‍රජාමූල සමිති වල නායකයින් ඇතුළු ගම්වාසින් හමුවී ඒම වසමේ පවතින පුහුණු අවශ්‍යතා හා ගැටළු හඳුනාගැනිමේ වැඩසටහනක් 2019.09.04 ක්‍රියාත්මක කරන ලද අතර ඒහිදි මත්ද්‍රව්‍ය අබ්බැහිවීම් වැඩ වශයෙන් ගම තුළ ඇති බව හෙළිදරවු වූ බැවින් ගමේ සාමාජිකයන්ගේ ආර්ථික, සාමාජීයය, අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

- **වැඩසටහනේ නම -** මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ඒක්දින පුහුණු වැඩසටහන.
- **සහභාගිවූවන්ගේ ස්වභාවය -** සමෘද්ධි ප්‍රතිලාභින් හා සිවිල් වැසියන් 100 දෙනෙකු සහභාගී විය
- **සංවිධානය කරන ලද ආයතනය -** ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය
- **ඉල්ලීම කරන ලද ආයතනය -** සුහුරු ගම්මාන වැඩසටහනෙහි පුහුණු අවශ්‍යතා තක්සේරුව අනුව හා ගමෙහි ප්‍රජා සමිති නායකයින්ගේ ඉල්ලීම මත
- **සහභාගි වූ ආයතන** - සමෘද්ධි කාර්යාලය ඇතුලුගමෙහි ප්‍රජා සමිති
- **දිනය** - 2019.10.10
- **දේශන මාතෘකා -** මත්ද්‍රව්‍ය නිවාරණය හා එහි ඇබ්බැහිය වළක්වාගැනීම

- **පුහුණු ක්‍රමවේදය -** දේශන /බහුමාධ්‍ය ඉදිරිපත් කිරීම්/කණ්ඩායම් සාකච්ඡා/ක්‍රියාකාරකම්
- **සහභාගිවූවන්ගේ ඇගයීම් නිගමන හා නිර්දේශ -** ඉතා යහපත් ප්‍රතිචාර ලැබුණු අතර ගමේ විශාල ගැටළුවක් බවට පත්ව තිබූ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් වැඩසටහනක් පැවැත්වීම පිළිබඳව අගය කොට සලකන ලදි.අතිදුෂකර ගම් ප්‍රදේශයක් වූ අඳුපැලැන වැනි ග්‍රාමීය ප්‍රදේශ වල ඇති ගැටළු නිරාකරණය හා ගම්වැසියන්ගේ දැනුම කුසලතා සංවර්ධන උදෙසා තවත් මෙවැනි පුහුණු වැඩසටහන් පැවැත්වීම යෝග්‍ය බව නිගමනය විය.
- **සම්පත්දායකත්වය -** පී.සී. හෙට්ටිආරච්චි මහතා හා රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ නිලධාරීන් සම්පත්දායකත්වය සපයන ලදී.

**2. මානසික සෞඛ්‍ය දිනය වෙනුවෙන් සියදිවි හානිකරගැනිම වැලැක්වීම පිළිබඳ වැඩසටහන**

**හැඳින්වීම -** ලෝක මානසික සෞඛ්‍ය දිනය නිමිති කොට ගනිමින් මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය තුළින් සියදිවි හානිකර ගැනීම වැලැක්වීම පිළිබඳ ඒක්දින පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි.

- **වැඩසටහනේ නම -** මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය තුළින් සියදිවි හානිකර ගැනීම වැලැක්වීම පිළිබඳ ඒක්දින පුහුණු වැඩසටහන
- **සහභාගිවූවන්ගේ ස්වභාවය -** හ/වාඩියගොඩ කණිෂ්ඨ විදුහලේ සිසුන් හා ගුරුවරු ඇතුළු 100 දෙනෙකු සහභාගී විය.
- **සංවිධානය කරන ලද ආයතනය -** ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය
- **ඉල්ලීම කරන ලද ආයතනය -** වාඩියගොඩ කණිෂ්ඨ විද්‍යාලය
- **සහභාගි වූ ආයතන -** හ/වාඩියගොඩ කණිෂ්ඨ විදුහල හා හම්බනතොට ප්‍රජා සෞඛ්‍ය ඒකකය
- **දිනය -** 2019.11.04
- **දේශන මාතෘකා -** මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය තුළින් සියදිවිනසා ගැනීම් වළක්වාගැනීම (පාසල් සිසුන් වෙනුවෙන් වූ විශේෂිත වැඩසටහනක් වශයෙන් පවත්වන ලදී.)
- **පුහුණු ක්‍රමවේදය -** දේශන /කණ්ඩායම් සාකච්ඡා /විඩියෝ /ප්‍රායෝගික ක්‍රියාකාරකම්/බුද්ධිකලම්භන

- **සහභාගිවූවන්ගේ ඇගයීම් නිගමන හා නිර්දේශ -** ඉතා යහපත් ප්‍රතිචාර ලැබුණු අතර පාසල් සිසුන්ගේසෞඛ්‍ය හා සම්බන්ධ මෙවැනි වැඩසටහන් තවත් ලබා දෙන ලෙස සිසුන් හා ගුරුවරුන්ගේ ඉල්ලීම විය. මෙවැනි මාතෘකා ඔස්සේ දෙදින පුහුණු වැඩසටහන් පැවැත්විය යුතු බව පාසලේ ගුරුවරන්ගේඅදහස විය.
- **සම්පත්දායකත්වය -** පී.සී. හෙට්ටිආරච්චි මයා හා වෛද්‍ය තිලිණි මිය (හම්බන්තොට ප්‍රජා සෞඛ්‍ය කාර්යාලය).

## 3. ක්ෂේත්‍ර අධීක්ෂකවරු සඳහා එක් දින පුහුණු වැඩසටහන

**හැඳින්වීම -** පුහුණු අංශයේ වාර්ෂික සැලැස්මට අනුව අප ආයතනය මගින් පවත්වනු ලබන සියලු ඩිප්ලෝමා පාඨමාලාවන්හි ක්ෂේත්‍ර සුපරීක්ෂකවරුන් වශයෙන් කටයුතු කරන දකුණු පළාත නියෝජනය කෙරෙන සුපරීකෂකවරුන් සඳහා ඒක්දින පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

- **වැඩසටහනේ නම -** ක්ෂේත්‍ර අධික්ෂකවරු සඳහා ඒක්දින පුහුණු වැඩසටහන
- **සහභාගිවූවන්ගේ ස්වභාවය -**සමාජ වැඩ, වෘද්ධ විද්‍යා හා වැඩිහිටි රැකවරණ හා උපදේශනය යන ක්ෂේත්‍රයන්හි කටයුතු කරන වෘත්තිකයින් 15කු සහභාගී විය.
- **සංවිධානය කරන ලද ආයතනය -** ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය
- **ඉල්ලීම කරන ලද ආයතනය -** පුහුණු අංශයේ වාර්ෂික වැඩ සැලැස්මට අනුව
- **සහභාගි වූ ආයතන -** ජාතික සමාජ සංවර්ධන ආයතනනය හා ක්ෂේත්‍ර අධික්ෂකවරු සේවා සපයන ආයතන නියෝජනය විය
- **දිනය -** 2019.12.10
- **දේශන මාතෘකා -** සිසුන් වඩාත් ඵලදායිව ක්ෂේත්‍ර කටයුතු සඳහා යොමුකරන ආකාරය ක්ෂේත්‍ර ක්ෂේත්‍ර අධික්ෂකවරු මුහුණපාන ගැටලු හා විශේෂයෙන් පුහුණු අංශය විසින් පාඨමාලාවන්ට අදාලව සකසන ලද ක්ෂේත්‍ර අත්පොතට අනුව සිසුන්ගේ අධික්ෂණ කටවුතු සිදුකෙරෙන ආකාරය සාකච්ඡා කරන ලදි.
- **පුහුණු ක්‍රමවේදය -** දේශන /කණ්ඩායම් සාකච්ඡා /වීඩියෝ /ඉදිරිපත්කිරීම්
- **සහභාගිවූවන්ගේ ඇගයීම් නිගමන හා නිර්දේශ -** වාර්ෂිකව මෙවැනි දැනුවත් කිරීම් කිරිමේ වැදගත්කම හා ක්ෂේත්‍රයේ නවකයින් තවත් පුහුණු කරගත හැකිනම් සමබරව සිය සේවාව සාර්ථකව ඉටුකළ ගත හැකි බවත් දකුණු පළාත සඳහා ඔවුනගේ සංගමයක් පිහිටුවා ගැනීමේ වැදගත්කම යොජනා විය.
- **සම්පත් දායකත්වය -** පී.සි. හෙට්ටිආරච්චි මයා, කාංචනා අධිකාරී මිය හා රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ නිලධාරීන් සම්පත් දායකත්වය සපයන ලදී.

## 4. සම්පත් දායකත්වය ලබා දීම

තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි අංශය විසින් සංවිධානය කරණු ලැබූ මත්ද්‍රව්‍ය නිවාරණය හා මානසික සෞඛ්‍ය සංවර්ධනය වෙනුවෙන් පවත්වන ලද වැඩසටහන් දෙකක් සඳහා සම්පත් දායකත්වය සපයන ලදී. මේ සඳහා තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රජාමූල සමිති නියෝජනය කරමින් සමාජික සමජිකාවන් 100 අධික පිරිසක් සහභාගී වී සිටියහ.

**2019 වර්ෂයේ ආදායම් හා වියදම් වාර්තාව**

**වගු අංක 12**
**රන්න මධ්‍යස්ථානයේ ආදායම් වියදම් විස්තරය**

| අනු අංකය | වියදම් විස්තරය | මුදල(රු.) |
|---|---|---|
| 01 | විදුලි බිල්පත් | 14,683.50 |
| 02 | ජල බිල්පත් | 21,066.95 |
| 03 | පරිපාලන වියදම් | 15,000.00 |
| | මුළු වියදම | **50,750.45** |

| අනු අංකය | ආදායම් විස්තරය | මුදල(රු.) |
|---|---|---|
| 01 | බාහිර පුද්ගලයන් සඳහා නේවාසික පහසුකම් සැපයීම මඟින් | 33,600.00 |
| 02 | * අභ්‍යන්තර නිළධාරීන්/දේශකවරුන් සඳහා නේවාසික පහසුකම් සැපයීම මඟින් | 1,600.00 |
| 03 | * පාඨමාලා/වැඩමුළු පැවැත්වීම මඟින් | 273,000.00 |
| | එකතුව | 308,200.00 |

* ඉහත වගු අංක 12 හි ආදායම් විස්තරයෙහි අනු අංක 02 සහ 03 මඟින් දක්වා ඇති වටිනාකම මුදලින් හෝ චෙක්පත් මඟින් අයකොට නොමැති අතර ලබාදුන් සේවාවේ අගය දැක්වීමක් පමණි.

## තලාව ප්‍රාදේශීය පුහුණු කිරීමේ මධ්‍යස්ථානය

**වගු අංක 13**
**2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ඩිප්ලෝමා පාඨමාලාවන්**

| | පාඨමාලාව | අධ්‍යයන වර්ෂය | ප්‍රතිලාභීන් ප්‍රමාණය | පවත්වන දින | පාඨමාලා ගාස්තු එක් පුද්ගලයකු සඳහා (රු.) | පාඨමාලාවේ වර්ථමාන තත්වය |
|---|---|---|---|---|---|---|
| 01. | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 2019 - 2021 | 47 | සති අන්ත | 51,000.00 | පංති කාමර දේශන පැවත්වීම |
| 02. | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 2018 - 2020 | 35 | සති අන්ත | 51,000.00 | අවසාන ක්ෂෙත්‍ර පුහුණුවේ අනයුක්ත කර ඇත |
| 03. | සමෘද්ධි නිළධාරින් සඳහා වූ උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 2018 - 2019 | 40 | සිකුරාදා/ සෙනසුරාදා/ ඉරිදා දිනවල | 51,000.00 | අවසාන ක්ෂෙත්‍ර පුහුණුවේ අනයුක්ත කර ඇත |

### 01. උපදේශනය පිලිබඳ ඩිප්ලොමා පාඨමාලාව 2018 /2020

මෙම පාඨමාලාව දැ අවුරුදු පාඨමාලාවක් වන අතර 2018. 05.05 දින ආරම්භ කරන ලද අතර මේ වන විට ඩිප්ලෝමා අපේක්ෂිකයින් 37 ක් සාර්ථකව අධ්‍යයන කටයුතු සිදු කරයි. අනුරාධපුර, කුරුණෑගල, පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වල පදිංචි රාජ්‍ය, පෞද්ගලික හා රැකියා විරහිත පිරිස් මේ සඳහා සහභාගී වේ.ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අභ්‍යන්තර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ වෙනත් භාහිර දේශකයන්ගේ සම්පත්දාරීන්ගේ මෙහෙයවීමෙන් පාඨමාලාව මෙහෙයවනු ලබන අතර සාර්ථක සහභාගිත්වයක් දක්නට ලැබේ. මෙම පාඨමාලාව මුදල් අයකර පවත්වන අතර එක් ශිෂ්‍යයෙකුගෙන් රු 51000.00 මුදලක් අය කරණු ලැබේ. සෑම මසකම තොරාගත් සති අන්ත දිනවල පාඨමාලාව පවත්වනු ලබයි. මේ පිළිබඳ විස්තර වගු අංක 13 මගින් දක්වා ඇත.

### 02. සමෘද්ධි නිළධාරින් සඳහා පවත්වනු ලබන මනෝ උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2018/2019

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ මෙහෙයවීමෙන් හා සමෘද්ධි දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් දිවයිනම ආවණරය වන පරිදි තෝරාගනු ලැබූ සමෘද්ධි නිළධාරින් සඳහා මෙම පාඨමාලාව පවත්වනු ලබයි.එක් අවුරුදු පාඨමාලාවක් වන අතර සෑම මසකම තොරාගත් දිනවල සිකුරාදා, සෙනසුරාදා, ඉරිදා දිනවල පවත්වනු ලබයි.ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අභ්‍යන්තර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ වෙනත් භාහිර දේශකයන්ගේ සම්පත්ධාරින්ගේ මෙහෙයවීමෙන් පාඨමාලාව මෙහෙයවනු ලබන අතර සාර්ථක සහභාගිත්වයක් දක්නට ලැබේ.

### 03. උපදේශනය පිලිබඳ ඩිප්ලොමා පාඨමාලාව 2019 /2021

මෙම පාඨමාලාව දැ අවුරුදු පාඨමාලාවක් වන අතර 2019. 08.24 දින ආරම්භ කරන ලද අතර මේ වන විට ඩිප්ලෝමා අපේක්ෂිකයින් 47 ක් සාර්ථීකව අධ්‍යයන කටයුතු සිදු කරයි. අනුරාධපුර, කුරුණෑගල, පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වල පදිංචි රාජ්‍ය,පෞද්ගලික හා රැකියා විරහිත පිරිස් මේ සඳහා සහභාගී වේ.ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අභ්‍යන්තර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ වෙනත් භාහිර දේශකයන්ගේ සම්පත් ධාරින්ගේ මෙහෙයවීමෙන් පාඨමාලාව මෙහෙයවනු ලබන අතර සාර්ථක සහභාගිත්වයක් දක්නට ලැබේ. මෙම පාඨමාලාව මුදල් අයකර පවත්වන අතර එක් ශිෂ්‍යයෙකුගෙන් රු 51,000.00 මුදලක් අය කරණු ලැබේ. සෑම මසකම තෝරාගත් සති අන්ත දිනවල පාඨමාලාව පවත්වනු ලබයි.

**වගු අංක 14**

**2019 වර්ෂයේ තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ සංවිධානය කරන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන්**

| | කෙටි කාලීන පුහුණු වැඩසටහන | පවත්වන ලද දිනය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | ග්‍රාමීය ප්‍රජා නිලධාරීන් සඳහා පැවැත්වූ කෙටි පුහුණු වැඩසටහන | 2019.03.25/26 | 25 |
| 02. | මානසික සෞඛ්‍ය දින වැඩසටහන | 2019.11.20 | 55 |
| 03. | ක්ෂේත්‍ර සුපරීක්ෂකවරුන් සඳහා පැවැත්වූ කෙටි පුහුණු වැඩසටහන | 2019.12.10 | 10 |

### 01. ග්‍රාමිය ප්‍රජා නිළධාරීන් සඳහා පැවත්වූ කෙටිකාලීන පුහුණු වැඩසටහන

ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රජා සංවිධානවල නිළධාරීන් සඳහා නායකත්ව පුහුණු වැඩ සටහනක් 2019.03.25/26 දිනවල පවත්වන ලදී. මේ සඳහා නිළධාරින් 26 දෙනෙකු සහභාගි විය. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය මගින් උපදේශකත්වය ලබා දෙන ලදී.

**02. මානසික සෞඛ්‍ය දින වැඩසටහන**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ තලාව ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය කේන්ද්‍ර ගත කරමින් පවත්වූ මානසික සෞඛ්‍ය දින වැඩසටහන2019.11.20 දින ප්‍රෙද්ශියේ තරුණ තරුණියන් හා ප්‍රජා සංවිධාන වල මුලිකත්වයෙන් පවත්වන ලදි මේ සඳහා සාමාජිකයින් 55 දෙනෙකු සහභාගී විය.

**03. ක්ෂේත්‍ර උපදේශක නිළධාරීන් වෙනුවෙන් පවත්වන ලද කෙටි කාලීන පුහුණු වැඩ සටහන**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ තලාව ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේ පවත්වන ඩිප්ලෝමා පාඨමාලා, උසස් ඩිප්ලෝමා පාඨමාලා සඳහා ක්ෂේත්‍ර උපදේශකයින් පුහුණු කිරීමේ අරමුණින් මෙම වැඩසටහන 2018.12. 10 දින පවත්වන ලදී. මේ සඳහා අප ආයතනය යටතේ සමාජ වැඩ. මනෝවිද්‍යා උපදේශනය, වෘද්ධවේදය, ළමා රැකවරණය ආදි ඩිප්ලෝමා පාඨමාලාවන් සාර්ථකව නිම කරන ලද ඩිප්ලෝමාධාරීන් 30 දෙනෙකු මේ සඳහා සහභාගි විය. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය මගින් උපදේශකත්වය ලබා දෙන ලද වැඩසටහන් පිළිබඳව වගු අංක 14 යටතේ ඉහත දක්වා ඇත.

**වගු අංක 15**

**2019 වර්ෂයේ පවත්වන ලද බාහිර පුහුණු පාඨමාලාවන්**

| | ආයතනය | දිනය |
|---|---|---|
| 01. | ප්‍රගති සේවා පදනම විසින් පැවැත්වූ පුහුණු වැඩසටහන් | 2019.05.14/15/16 |
| 02. | කරිටාස් ආයතනය විසින් පැවැත්වූ පුහුණු වැඩසටහන් | 2019.07 24/25 |
| 03. | උ. මැද පළාත් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් සිදු කල ව්‍යවසායකත්ව නගා සිටුවීමේ පුහුණු වැඩසටහන් | වර්ෂය පුරාම |
| 04 | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පැවැත්වූ පුහුණු වැඩසටහන් | 2019.10.04/05 |

**තලාව නේවාසික පුහුණු මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම.**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ තලාව ප්‍රාදේශීය පුහුණු කිරිමේ මධ්‍යස්ථානය නේවාසික මධ්‍යස්ථානයක් ලෙසද භාවිතා කරනු ලබයි. ප්‍රධාන ගොඩනැගිල්ට අදාලව VIP කාමර 01 (වායු සමනය කළ ) සහ 40 දෙනෙකුට නේවාසික පහසුකම් සපයා දිමට හැකිය. මිට අමතරව ප්‍රධාන දේශන ශාලාව (අඩි 60x30) ප්‍රමාණයේ ආසන 80 පමණ ඇත.

ආයතනය විසින් නියම කරන ලද මිල ගණන් යටතේ රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශය සඳහා පුහුණු වැඩ සටහන් සඳහා මෙන්ම නේවාසික අවශ්‍යතා සඳහා මධ්‍යස්ථානයේ නේවාසිකාගාර භාවිතා කරනු ලබයි. මේ තුළින් ආයතනයට අමතර ආදායමක් මෙන්ම ජාතික මට්ටමෙන් විශාල සේවයක් සිදු කරනු ලබයි. එමෙන්ම ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ක්ෂේත්‍ර ගත සිසුන්ගේ නේවාසික කටයුතු සඳහා මෙන්ම ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා, පුහුණු වැඩ සටහන් සඳහා නේවාසික කටයුතු ලබාදිය හැකි ආයතනය සතු එකම මධ්‍යස්ථානය වන්නේ තලාව ප්‍රදේශිය ඉගෙණුම් මධ්‍යස්ථානයයි. තවද ආයතනය මගින් පවත්වන ඩිප්ලෝමා පාඨමාලා, උසස් ඩිප්ලෝමා පාඨමාලා සඳහා දුර බැහැර සිට පැමිණෙන සිසුන් සඳහා නේවාසික පහසුකම් ලබා දිම තුළින් සිසුන් හට මහත් පිටුවහලක් ලැබෙන අතර සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහාද මහත් සම්පතක් බවට ප්‍රාදේශිය මධ්‍යස්ථානය පත්ව ඇත.

**ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ සේවා විද්‍යාලය/පුහුණු අංශය මගින් මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගනිමින් පැවත්වූ වැඩසටහන්**

01. සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2018/2019 අධ්‍යයන වර්ෂයට අදාල විෂය අවශ්‍යතාවයක් මත සංවිධානය කරණු ලබන ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව තලාව ප්‍රාදේශිය මධ්‍යස්ථානය කේන්ද්‍ර කර ගනිමින් අනුරාධපුර හා වව්නියාව දිස්ත්‍රික්ක වල සුබසාධන ආයතන නිරික්ෂනය කරන ලදි. 2019.10 06-11 එම වැඩසටහනට අවශ්‍ය නේවාසික පහසුකම් හා සේවා සංවිධාන කටයුතු තලාව ප්‍රාදේශිය මධ්‍යස්ථානය විසින් සිදු කරන ලදී.

02. පුහුණු අංශය මගින් පවත්වන දෙමළ මාධ්‍ය උපදේශනය පාඨමාලාවේ (අම්පාර) ශිෂ්‍ය කණ්ඩායමේ අධ්‍යයන අවශ්‍යතාවයක් වෙනුවෙන් සංවිධානය කරණු ලැබූ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව අනුරාධපුර හා වව්නියාව දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් පවත්වන ලදි. 2019. 03 .28 දින අවශ්‍ය නේවාසික පහසුකම් හා සේවා සංවිධාන කටයුතු තලාව ප්‍රාදේශිය මධ්‍යස්ථානය විසින් සිදු කරන ලදී.

03. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය මගින් පැවත්වූ ලෝක මානසික සෞඛ්‍ය දින වැඩ සටහන 2019.11.20 දින අනුරාධපුර යොවුන් නිකේතනයේ පවත්වන ලදි. ඒ සඳහා අවශ්‍යසේවා සංවිධාන කටයුතු තලාව ප්‍රාදේශිය මධ්‍යස්ථානය විසින් සිදු කරන ලදී.

**ආදායම් වියදම් විස්තරය**


**වගු අංක 16**

**2015 වර්ෂයේ සිට 2019.12 මස දක්වා තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ආදායම් තත්වය**

| | 2015 (රු.) | 2016 (රු.) | 2017 (රු.) | 2018 (රු.) | 2019 (රු.) |
|---|---|---|---|---|---|
| මුදල්මය ආදායම | 93,560.00 | 258,619.00 | 155,160.00 | 510,800.00 | 232,000.00 |
| මුදල්මය නොවූ ආදායම් | 337,000.00 | 420,650.00 | 657,900.00 | 1,120,020.00 | 705,700.00 |

තලාව ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේ කරගෙන යනු ලබන පාඨමාලාවලින් ලබාගත් ආදායම් හා මූල්‍ය නොවන වටිනාකමකින් යුක්ත ආදායම් විස්තරය වගු අංක 16 යටතේ දක්වා ඇත.

ප්‍රස්ථාර අංක 01





වගු අංක 17

2019 වර්ෂයේ ආදායම් විස්තරය මාසිකව

| මාසය | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජුනි | ජුලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුදල්මය රුපියල් | 18400 | 17700 | 12400 | 22850 | 30950 | 16500 | 13700 | 33250 | 7000 | 39550 | 13700 | 6000 |
| නොමිලේ රුපියල් | 79050 | 29000 | 77250 | 42000 | 35000 | 70700 | 71100 | 77000 | 67700 | 37350 | 73850 | 45700 |

**ප්‍රස්ථාර අංක 02**




**වගු අංක 18**
**2019 තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ වියදම් විස්තරය**

| ජලය | විදුලිය | දුරකථන | අනිකුත් | මුළු වියදම |
|---|---|---|---|---|
| රු.73,723.00 | රු. 120,072.00 | රු.36,840.00 | රු. 48,662.00 | රු.279,297.00 |

ඉහත සඳහන් ප්‍රස්ථාර අංක 02 අදායම් හා වගු අංක 18 මගින් තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ වියදම් විස්තර දක්වා ඇත.

**<u>2019 වර්ෂයේ මධ්‍යස්ථානයේ සිදුවූ සංවර්ධන කටයුතු</u>**

01. අලුතින් නිදන ඇඳන් 25 මිලදී ගැනීම.
02. සෝෆා සෙට් එකක් මිලදී ගැනීම.
03. අලුතින් පරිඝනකයක් ලබා දීම.

**2019 වර්ෂයේ මානසික සෞඛ්‍ය දිනය වෙනුවෙන් තරුණ තරුණියන් සඳහා පැවැත්වූ කෙටි පුහුණු වැඩසටහන**

ජාතික සමාජ සංවර්ධන ආයතනයට අයත් තලාව අප ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ මෙම වර්ෂය තුල කෙටි පුහුණු වැඩසටහන පවත්වන ලදී. විස්තර පහත දැක්වේ.

| | | |
|---|---|---|
| දිනය | : | 2019 නොවැම්බර් මස 20 වන දින |
| පාඨමාලාවේ නම | : | මානසික සෞඛ්‍ය දිනය වෙනුවෙන් තරුණ තරුණියන් සඳහා පැවැත්වූ කෙටි පුහුණු වැඩසටහන |
| කවුරුන් සඳහා ද | : | තරුණ තරුණියන් සඳහා |

| | | |
|---|---|---|
| සහභාගීවූවන් | : | වෛද්‍ය ප්‍රනාන්දු මහතා,ඉරෝන් ජයසේකර මහතා,ස්ථානභාර නිලධාරී සහන් ප්‍රේමරත්න මහතා |
| සිසු සහභාගිත්වය | : | 60 |
| සහතිකපත්‍ර | : | 55 |
| බලාපොරොත්තු වූ සංඛ්‍යාව | : | 80 |
| ලබා දෙන ලද සේවා | : | ආයතනය මගින් සහතිකපත්‍ර ලබා දීම.<br>ආයතනය මගින් සවස කෙටි ආහාර සමඟ කිරිතේ ලබා දීම. |

**2019 වර්ෂය සඳහා පැවැත් වූ පුහුණු වැඩසටහන සුහුරු ගම්මාන වැඩසටහන**

01.

| | | |
|---|---|---|
| දිනය | : | 2019 නොවැම්බර් 27 සහ 28 දෙදින |
| පාඨමාලාවේ නම | : | PRA-Participatory Rural Appraisal |
| කවුරුන් සඳහා ද | : | **ගම් වාසීන් සඳහා** |
| සහභාගීවූවන් | : | එම්.එස්.එම්. අස්මියාස් මහතා, හැරී හරිතාමෝතරන් මහතා, ඒ.එච් . උබයදුල්ලා මහතා, බී.කේ.එස්. කරුණාරත්න මහතා, පී.සී.හෙට්ටිආරච්චි මහතා, දීප්ති නිරෝෂනී මහත්මිය, චන්දිමා විජේසේකර මහත්මිය, ස්ථානභාර නිලධාරී සහන් ප්‍රේමරත්න මහතා |
| සිසු සහභාගිත්වය | : | 25 |
| සහතිකපත්‍ර | : | 50 |
| ලබා දෙන ලද සේවා | : | ආයතනය මගින් සවස කෙටි ආහාර සමඟ කිරිතේ ලබා දීම |

02.

| | | |
|---|---|---|
| දිනය | : | 2019 දෙසැම්බර් 10 වන දින |
| පාඨමාලාවේ නම | : | දෙමව්පියන් සහ ළමුන්ගේ වැඩසටහන |
| කවුරුන් සඳහා ද | : | ළමුන්ට සහ දෙමව්පියන්ට වෙන් වෙන් වශයෙන් පවත්වන ලදී |
